# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1947/7 - 2015 දෙසැම්බර් මස 28 වැනි සඳුදා - 2015.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## අතුරු ව්‍යවස්ථා

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය යටතේ පළ කරනු ලබන නිවේදනය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමා විසින් සාදනු ලදුව අංක 1888/46 හා 2014 නොවැම්බර් මස 14 දාතමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ නගර සභා කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා, සංශෝධන සහිතව පහත උපලේඛනයන්හි සඳහන් ආකාරයට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව 2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කළ බව මෙයින් නිවේදනය කරමි.

ඉසුර දේවප්‍රිය,
බස්නාහිර පළාතේ, ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන,
ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන
හා පළාත් පරිපාලන, ආර්ථික සංවර්ධන, විදුලිබල හා
බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන
සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 23 වැනි දින,
කොළඹ 07,
ශ්‍රාවස්ථි මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ, ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සැරසිලි විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශයේ සැරසිලි විධිමත් කිරීම පාලනය කිරීම හා ගාස්තු අයකිරීම සඳහා පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශයේ සැරසිලි විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

3. නගර සභා සීමාව තුළ පිහිටි වීථිවල මහජනයා විසින් සිදුකරනු ලබන සැරසිලි විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

4. මෙහි මින් මතු නගර සභාවේ සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියා නිකුත් කරන ලද අවසරපත්‍රයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් නගර සභා බල ප්‍රදේශයේ වීථි හා ප්‍රසිද්ධ ස්ථානයන්හි සැරසිලි කිරීම නොකළ යුතු ය.

5. කවර හෝ සැරසිල්ලක් සඳහාම අවසර පත්‍රයක් ලබා ගැනීමේදී මෙම අතුරු ව්‍යවස්ථාවේ I වන උපලේඛනය අනුව අයදුම්පතක් සැරසිලි කිරීමට යටත් පිරිසෙන් පැය 48 කට පෙර සභාවට ඉදිරිපත් කළ යුතු ය.

6. අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් පසු සැරසිලි සිදු කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව අවසර පත්‍රයක් සභාපතිවරයා විසින් නිකුත් කරනු ඇත.

7. අවසර පත්‍රයක් යටතේ වුවද කවර හෝ සැරසිලි සඳහා කවර හෝ අවස්ථාවක පොලිතීන් භාවිතා නොකළ යුතු ය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වන සෑම අවසර පත්‍රයක් සඳහාම අයකළ යුතු ගාස්තු සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියක් මගින් තීරණය කරන ගාස්තු විය යුතු ය.

(අ) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සෑම සැරසිලි කාර්යයක් සඳහා ඉල්ලුම් කරනු ලබන සෑම තැනැත්තෙක්ම ඒ සඳහා සභාව විසින් තීරණය කරන ඇති පරිදි තැන්පතු මුදලක් සභාවේ තැන්පත් කළ යුතු ය.

(ආ) අවසර පත්‍රයක් ලත් යම් තැනැත්තෙකු විසින් කරනු ලබන යම් සැරසිල්ලක් අවසර පත්‍රයේ සඳහා සැරසිලි ඉවත් කළ යුතු යැයි සඳහන් දිනයෙන් පැය 24ක් තුළ සැරසිලි ඉවත් කරනු නොලැබේ නම්, සභාව විසින් එම සැරසිලි ඉවත් කර, ඊට වැය වූ වියදම් සභාවේ ඒ සඳහා තැන්පත් මුදලින් අයකර, යම් ඉතිරි මුදලක් වේනම්, එය තැන්පත්කරු වෙත ආපසු ගෙවීම නීත්‍යානුකූල වන්නේ ය.

9. 8 වන වගන්තියෙහි සඳහන් විධිවිධාන අවමංගල්‍ය සැරසිලි සඳහා අදාළ නොවන්නේ ය.

10. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ කරනු ලබන සැරසිල්ලක්, ප්‍රදේශයේ මාර්ග සංඥා පුවරු, ප්‍රදේශ සිතියම් හා නාමපුවරු වැසී යන සේ හෝ අවහිර වන සේ නොකළ යුතු ය.

11. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

''සභාව'' යන්නෙන් නගර සභාව අදහස් වේ.
"සභාපතිවරයා" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"සැරසිල්ලක් " යන්නෙන් යම් සිද්ධියක් හෝ යම් කාර්යයක් අරමුණු කරගත්, කෘත්‍රිම හෝ ස්වාභාවික ද්‍රව්‍යවලින් යුතුව, එම සිද්ධිය හෝ කාර්යය නියෝජනය කිරීම සඳහා තාවකාලිකව කරනු ලබන සකස් කිරීම් ද අදහස් වන අතර, යම් ආගමික හෝ වාර්ෂික උත්සවයක් අරමුණු කර ගනිමින් කරනු ලබන කොඩි, ධජ පාතක ප්‍රදර්ශනයක් අදහස් නොවේ.

*I වන උපලේඛනය*

*අයදුම්පත්‍රය*

1. සැරසිලි කරන වීථියේ හෝ ප්‍රසිද්ධ ස්ථානයේ නම :
2. සැරසිල්ලේ ස්වභාවය :
3. සැරසිලි කරන කාල සීමාව :
4. සැරසිල්ල කුමක් අරභයාද යන වග :
5. සැරසිලි ඉවත් කර ගන්නා දිනය :
6. ඉවතලන දෑ බැහැර කරන ආකාරය කෙසේ ද ? යන්න.

නගර සභාවේ පිළිගත් නියමයන්ට එකඟව සැරසිළි ප්‍රදර්ශනය කිරීමට එකඟ වන අතර, ඒ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හෝ එහි යම් වගන්තියක් උල්ලංඝනය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව ද, හොඳාකාරවම මම දනිමි.

.......................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :.............................

**බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වනු ලබන බේකරි විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සඳහා පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ

3. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභා බල ප්‍රදේශය තුළ බේකරියක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

4. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතු ය.

5. මෙම අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ බේකරියකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(1) බේකරියේ නිෂ්පාදනය කරන කෑම වර්ග සඳහා තාපය ලබා ගන්නා මාධ්‍ය කවරක් වුව ද මේ ඡේදයේ සඳහන් නියමයන් ඒ සඳහා සම්පූර්ණ කර තිබිය යුතු ය.

(i) බේකරිය මනා අළුත්වැඩියා තත්ත්වයකින් තිබිය යුතු ය.
(ii) බේකරියේ සෑම කාමරයකම පිටතට විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර, විවෘත කළ විට ජනේල කවුළුවල වර්ගඵලය කාමරයේ භූමියේ වර්ගඵලයෙන් පහලොවෙන් එකකට නොඅඩු විය යුතු ය.
(iii) සෑම කාමරයකම සිවිලිමක් සවිකර තිබිය යුතු අතර සුදු පාටින් තීන්ත අලේපකර තිබිය යුතු ය.
(vi) සෑම කාමරයකම බිම සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.
(v) බේකරියේ උඳුන ස්ථානගත කරනු ලබන කාමරය පොළොව මට්ටමේ සිට සිවිලිම මට්ටම දක්වා අවම වශයෙන් මීටර් 3ක් උසට තිබිය යුතු අතර ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ බිත්තිය දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේපකර තිබිය යුතු ය.
(vi) බේකරියේ උඳුන ස්ථානගත කළ කාමරය හැර සෙසු සෑම කාමරයක්ම පොළොව මට්ටමේ සිට සිවිලිම මට්ටම දක්වා අවම වශයෙන් මීටර් 2.75ක් උසට තිබිය යුතු අතර ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් හෝ අළුමිනියම් සහ ලීයෙන් හෝ බැඳ දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේපකර තිබිය යුතු ය.

(vii) බේකරිය තුළ ලීයෙන් කළ සියලුම සවිකිරීම් කොටස්වල තීන්ත ආලේපකර තිබිය යුතු ය. වහලය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර පියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 1.8කට ඉහළින් තිබිය යුතුවාත් හැර අගු වාසිය අවම වශයෙන් මීටර් 1ක් විය යුතු ය.

(viii) නිෂ්පාදන කාර්යය සඳහා පානය කිරීමට සුදුසු තත්ත්වයේ ජලය පාවිච්චි කිරීමට විධිවිධාන සලසා තිබිය යුතු ය.

(ix) නිෂ්පාදන කාර්යය සඳහා ජලය පාවිච්චි කරන සෑම කාමරයකට ම ආරක්ෂිත ජල සැපයුමක් නළ මගින් සපයා තිබිය යුතු අතර බැහැර කරන අපවිත්‍ර ජලය ගලායාමට ප්‍රමාණවත් ජලාපවහන ක්‍රමයක් සකස් කර තිබිය යුතු ය.

(x) බැහැර කෙරෙන අප ජලය උරාගන්නා වළකට ගලා යාමට සලස්වා තිබිය යුතු ය.

(xi) මෙම අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ආකාරයට අප ද්‍රව්‍ය බැහැර කිරීමේ වැඩ පිළිවෙලක් ඇතිකර තිබිය යුතු ය.

(2) බලපත්‍රය ඉල්ලා සිටින බේකරිය, දර පාවිච්චි කරන බේකරියක් වන විට,

(i) බේකරියේ උඳුනේ දුම් කවුළුවේ ඉහළ කෙළවර අවම වශයෙන් පොළොව මට්ටමෙන් මීටර් 7.5 උසට බැඳ තිබිය යුතු ය.

(ii) පිටි අනන සියලුම මේස මතුපිට පළුදු නොතිබෙන සේ සුමට කර තිබිය යුතු අතර ලී පිරිද්දුම් අතර හිඩැස් නොමැති වන සේ පුරුද්දා තිබිය යුතු ය. නැතහොත් මල නොබැඳෙන ලෝහ තහඩුවකින් පිරිමැද්දවලින් තොරව ආවරණ කර තිබිය යුතු ය.

(ii) බේකරි උඳුනෙන් ඉවත් කරන දැවී ගිය අළු සහ ශේෂ දැව කොටස් ඉවත් කිරීමට ප්‍රමාණවත් එහා මෙහා ගෙන යා හැකි භාජනයක් සපයා තිබිය යුතු ය.

(iv) බේකරි උඳුනේ පිටත තීන්ත හෝ හුණු ගා තිබිය යුතු ය.

(v) සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර, බේකරියට විදුලිය සම්බන්ධතාව ලබාගෙන ඇත්නම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණය සපයා තිබිය යුතු ය.

3. බලපත්‍රය ඉල්ලා සිටින බේකරිය විදුලි බලයෙන් ක්‍රියා කරන බේකරියක් වන විට.

(i) බේකරි උපකරණවලට විදුලිය සම්බන්ධ කරන විදුලි පේනු ආරක්ෂිත තත්ත්වයේ පැවතිය යුතු අතර අධි වොල්ටීයතාවය ඇතිවන අවස්ථාවකදී හෝ විදුලිය කාන්දු වීමකදී විදුලිය ස්වයංක්‍රීයව විසන්ධි කෙරෙන උපකරණ සවිකර තිබිය යුතු ය.

(ii) බේකරි පරිශ්‍රය තුළ සවිකර ඇති විදුලි පරිපථවල විදුලි රැහැන් පිටතට විදුලිය කාන්දුවීම්වලින් තොර බට හෝ පෙට්ටි ඇතුළතින් ඇද තිබිය යුතු අතර පිටතට නිරාවරණය වූ විදුලි රැහැන් කෙළවරවල් නොතිබිය යුතු ය.

(iii) සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සහ විදුලි පරිපථවල විදුලි රැහැන් පිටතට විදුලිය කාන්දුවීම්වලින් තොර බට හෝ පෙට්ටි ඇතුළතින් ඇද තිබිය යුතු අතර පිටතට නිරාවරණය වූ විදුලි රැහැන් කෙළවරවල් නොතිබිය යුතු ය.

6. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි 5 වන අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති සෑම කොටසක ම අවම වශයෙන් සෑම වර්ෂයකට ම එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීම කල යුතු ය.

7. පිටි ඇනීම සඳහා යොදා ගන්නා සෑම කාමරයකම ගෙබිම සහ මේසය යටත් පිරිසෙයින් සෑම දිනයකම එක් වරක්වත් සේදීමට සැලැස්විය යුතු ය.

8. බේකරිය සහ එහි වටපිටාව ද, කාණු, ලී බඩු හා උපකරණ ද පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් තබා ගත යුතු ය.

9. බේකරි නිෂ්පාදන සඳහා යොදා ගන්නා පිටි සහ වෙනත් ද්‍රව්‍ය කල් ඉකුත් වීමේ දිනය ප්‍රමාණවත් කාලයක් ඉදිරියට පවතින්නේ නම් මිස කවර හෝ අවස්ථාවක එකී ද්‍රව්‍ය බේකරි නිෂ්පාදන කටයුතු යොදා ගැනීම නොකළ යුතු ය.

10. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයට හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

11. බේකරියේ සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් බේකරියේ සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවටත් බේකරියේ කාර්යයන්හි නියුක්ත වීමට පෙර හොඳින් ඇඟ සෝදා පිරිසිදු වී සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

12. (1) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය,

(i) ජෛවහායන අපද්‍රව්‍ය ;
(ii) වීදුරු ;
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය ;
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ;
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍ය වලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේදී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ;
(vii) අන්තරායකාර අපද්‍රව්‍ය.

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කර්යය විය යුතු ය.

(2) ඉහත උපවගන්තියේ ආකාරයට වර්ග කරන ලද අපද්‍රව්‍ය සභාවේ කළමණාකරන වැඩපිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා නියම කරන ලද ආකාරයෙන් අවසන් බැහැර කරලීම කළ යුතු ය.

13. බේකරි නිෂ්පාදන සඳහා මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු ජලය යොදා ගැනීම නොකළ යුතු ය.

14. බේකරියේ පාවිච්චි සඳහා තබා ගන්නා පිටි සහ වෙනත් ද්‍රව්‍ය ගබඩා කිරීමට ඒ සඳහා ම වෙන්වූ වෙනම කාමරයක් යොදාගෙන තිබිය යුතු අතර එකී කාමරය ප්‍රමාණවත් වාතාශ්‍රය සහිත වූ ද මැස්සන්ට හෝ වෙනත් කෘමි සතුන් සහ මීයන්ට ඇතුළුවිය නොහැකි ලෙස ආරක්ෂා කර තිබිය යුතු ය.

15. 14 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගබඩා කාමරයේ ගබඩා කාමරයේ පිටි ගබඩා කිරීමේදී, අවම වශයෙන් පොළොව මට්ටමෙන් සෙන්ටි මීටර් 20ක් උස පාද මත තැනු ලැලි තට්ටුවක් යොදාගත යුතු අතර එකී ලැලි තට්ටුව හිස්ව තිබෙන විට පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි අකාරයෙන් නිම කර තිබිය යුතු ය. එසේම එකී ලැලි තට්ටුව යටින් මීයන්ට සහ කවර හෝ වර්ගයක කෘමීන්ට රැඳී සිටිය නොහැකි වන සේ ආවරණය කර තිබිය යුතුවාත් හැර අවම වශයෙන් බිත්තියෙන් සෙන්ටි මීටර් 23ක් ඈතින් තබා තිබිය යුතු ය.

16. 15 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලැලි තට්ටු අවම වශයෙන් මාසයකට දෙවරක් බැගින් කාමරයෙන් පිටතට ගෙන පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

17. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රලත් කවර හෝ ස්ථානයක, කවර හෝ තැනැත්තෙකු නිදා ගැනීම නොකළ යුතු අතර, බේකරියේ කාර්යය සඳහා පාවිච්චි කරන උපකරණ හෝ ද්‍රව්‍ය හෝ නොවන වෙනත් යම් ද්‍රව්‍යයක් තැබීම හෝ ගබඩා කර තැබීම හෝ නොකළ යුතු ය. එසේ වුව ද බේකරියේ සේවයේ නියුක්ත තැනැත්තන් සඳහා වෙනම වෙන්කර දී ඇති විවේක කාමරයක් හෝ ආහාර ගැනීමේ කාමරයක් මෙයට ඇතුළත් නොවිය යුතු ය.

18. බේකරියේ සේවයේ නියුක්ත සේවකයන් සඳහා ප්‍රමාණවත් පරිදි වැසිකිළි හා කැසිකිළි පහසුකම් සලසා තිබිය යුතු ය.

19. බේකරියේ කාර්යය සඳහා යොදා ගන්නා ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම් එකී ටැංකියේ සිට අවම වශයෙන් මීටර් 18කට අඩු දුරකින් වැසිකිළි වළක්, කසල වළක් හෝ පෝර වළක් හෝ අළු වළක් හෝ ස්ථානගත කර නොතිබිය යුතු ය.

20. බේකරියේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහා ම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

21. කවර හෝ තැනැත්තෙකු විසින් බේකරිය ඇතුළත නිශ්චිතව ඒ සඳහා වෙන්කළ ස්ථානයක හැර දුම්බීම හෝ බුලත් සැපීම හෝ වෙනත් කවර හෝ ද්‍රව්‍යයක් සැපීම හෝ ආහාර ගැනීම හෝ නොකල යුතු ය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සෑම ස්ථානයකම හොඳින් පෙනෙන තැනක සම්මත පඩි සහිත තාරාදියක් හෝ වෙනත් කිසියම් වර්ගයක සම්මත තරාදියක් තැබීමට සැලැස්වීම සහ කිසියම් ගනුදෙනුකරුවෙකු විසින් ඉල්ලා සිටි විට විකුණන හෝ විකිණීමට ප්‍රදර්ශනය කර ඇති යම් බේකරි නිෂ්පාදනයක බර කිරා බැලීමට හෝ බර කිරා පෙන්වීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

23. කිසියම් බේකරියක නිෂ්පාදනය කරන බේකරි නිෂ්පාදන බලපත්‍රලාභියා විසින්ම ප්‍රවාහන කිරීම කරනු ලබන්නේ නම් දූවිලි හෝ වෙනත් අපද්‍රව්‍ය හෝ ජලය ඇතුල්විය නොහැකි වන සේ ආවරණය කළ පෙට්ටි යොදා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

24. මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

25. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බේකරියක නිෂ්පාදනය කෙරෙන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නිත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

26. මෙම අතුරු ව්‍යවස්ථාවේ යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් බේකරියක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 5 වන වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

27. 26 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුව ද ඒ ආකාරයෙන් දිර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

28. 26 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූළ විය යුතු ය.

29. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝණය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන නගර සභා පනතේ 126 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

30. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධ අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

"සභාව" යන්නෙන් නගර සභාව අදහස් වේ.
"සභාපති " යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.
''නගර සභා බල ප්‍රදේශය'' යන්නෙන් නගර සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය අදහස් වේ.
''බලයලත් නිලධාරියා'' යන්නෙන් නගර සභාවේ සභාපති විසින් නිශ්චිත කාර්යයක් සඳහා බලය පවරන ලද නිලධාරියා අදහස් වේ.

**පීඩාකාරී ව්‍යාපාර, අන්තරායදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ පීඩාකාරී ව්‍යාපාර, අන්තරායදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ පීඩාකාරී ව්‍යාපාර, අන්තරායදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. නගර සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර, කිසිම තැනැත්තකු නගර සභා බල ප්‍රදේශය තුළ, මෙම අතුරු ව්‍යවස්ථාවේ උපලේඛන යටතේ දැක්වෙන පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරායදායක ව්‍යාපාරයක් හෝ පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාරයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

4. කලින් අවලංගු නොකළහොත් මිස එවැනි සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහා ද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින දක්වා බල පැවැත්විය යුතු ය.

5. ව්‍යාපාරයේ පරිශ්‍රය සහ එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ස්ථිර ගොඩනැගිල්ලක් වේ නම් එය සභාපති විසින් අනුමත සැලැස්මකට අනුකූලව ඉදි කරන ලද ගොඩනැගිල්ලක් විය යුතු අතරම, එම ගොඩනැගිල්ල, පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, කිසිදු තැනැත්තෙක් පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරායදායක ව්‍යාපාරයක් හෝ පිඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට හිමිකමක් නොලබන්නේ ය.

   (අ) පරිශ්‍රය හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයකින් සහ මනා වාතාශ්‍රයක් හා අලෝකයක් ලැබෙන පරිදි සකස් කර තිබිය යුතු අතර, සෑම කාමරයක් විවෘත කළවිට ගෙබිමේ ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ප්‍රමාණයේ ජනෙල් සවිකර තිබිය යුතු ය.

   (ආ) සෑම කාමරයකම බිත්තිවල සෑම කොටසක උස මීටර් 2.14ට නොඅඩු විය යුතු අතර, ගඩොල්, කළුගල්, කබොක් හෝ සිමෙන්ති ගල් වලින් සාදා තිබිය යුතු ය. බිත්තිවල ඇතුල් පැති අවම වශයෙන් ගෙබිමේ සිට මීටර් 2ක් උසට සිමෙන්ති බදාම යොදා කපරාදු කොට තිබිය යුතු ය අතර, ඉතිරි කොටස හුණු බදාම යොදා කපරාදු කොට වර්ණ ආලේප කර තිබිය යුතු ය.

   (ඇ) සෑම පියසි කෙළවරකම ගෙබිමේ සිට මීටර් 2ට වැඩි උසකින් තිබිය යුතු ය.

   (ඈ) වහලය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතු ය.

   (ඉ) දැව කර්මාන්ත සියල්ල තෙල් සායම් හා හෝ හුණු ගා තිබිය යුතු ය.

   (ඊ) සම්පූර්ණ ගෙබිම සිමෙන්තියෙන් තනවා තිබිය යුතු ය.

   (උ) පරිශ්‍රය ප්‍රමාණවත් ජලවහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතු ය.

   (ඌ) පරිශ්‍රයෙහි සනීපාරක්ෂක කසළ භාජන සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු ය.

6. සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාරය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියළු ද්‍රව්‍ය දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතු ය.

7. බලපත්‍රධාරියෙකු විසින් පීඩා ඇති වීමට හෝ දුගඳ හැමීමට ඉඩ ඇති ද්‍රව්‍ය පොදු ස්ථානයක හෝ මංමාවත් ඔස්සේ රැගෙන යාමේදී කිසිදු පීඩාවක් ඇති නොවන සේ ආවරණය කරන ලද, උරා නොගන්නා භාජනවල දමා රැගෙන යා යුතු ය.

8. සෑම බලපත්‍රධාරියෙකුම, යම්කිසි නිෂ්පාදන ක්‍රියාවලියකදී විමෝචනය වන පීඩාකාරී ශබ්ද, වාෂ්ප හෝ වායු, ඒවා විහිදී යාමේදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හා උසකින් වායුගෝලයට මුදා හැරීම කළ යුතු ය. නැතහොත් ගින්දර හෝ සනීකරණ උපකරණයක් තුළින් පිටවීමට සැලැස්විය යුතු ය.

9. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළ යුතු අතර, ඒවා දිනපතා සේදීම කළ යුතු ය.

10. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම, යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ඉදිකරවිය යුතු අතර, හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතු ය.

11. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාර කරගෙන යනු ලබන කාලයේ දී, වාර්ෂිකව එම පරිශ්‍රයේ වර්ණ ආලේප කළ යුතු ය.

12. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාරික කටයුතුවලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියළු ආම්පන්න පිරිසිදු කර තබා ගත යුතු ය.

13. සෑම බලධාරියෙකුම, ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසළ, අතුගා එකතු කරනු ලබන බොල්, රොඩු සමඟ අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන. ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතු වලට වහාම නොයොදවන්නේ නම්, ආවරණය කරන ලද භාජනවල බහා දිනපතා ප්‍රාදේශීය සභාවේ නියමය පරිදි ඉවත් කළ යුතු ය.

14. සෑම බලපත්‍රධාරියෙකුම, හම් හෝ වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතු ය.

15. සෑම බලපත්‍රධාරියෙකුම, යම් ගංගාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක් යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ පීඩාකාරී ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලායාමට සැලැස්වීමෙන් හෝ පීඩාකාරී ද්‍රව්‍යයක් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංගාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ලිඳක්, වැවක් හෝ විවෘත ජල ප්‍රදේශයක් අපවිත්‍ර කිරීම නොකළ යුතු ය.

16. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙකු විසින් රාජකාරී වේලාවන් තුළ දී, පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරායදායක ව්‍යාපාරයක් හෝ පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාරයක් කරගෙන යනු ලබන පරිශ්‍රයට ඇතුළු වී පරීක්ෂාකර බැලීම නීත්‍යානුකූල වන්නේ ය. තවද බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේ ය.

17. බලපත්‍රලත් පරිශ්‍රයක්, මෙම අතුරු ව්‍යාවස්ථාවල සඳහන් විධිවිධාන වලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක, යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළ යුතු කාර්යයන්, නියමිත කාලයක් ඇතුළත දී ඉටුකරන ලෙස, බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභපතිවරයාට බලය ඇත්තේ ය. තවද යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියා කළ යුතු ය. එසේ ක්‍රියා නොකරන්නේ නම්, එවැනි අවස්ථාවක බලපත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේ ය.

18. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ කිසියම් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගැනීම පිණිස යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමා වෙත ලැබී දින 30ක් ඇතුළත, පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූල වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපවතිවරයාගේ කාර්යය වන්නේ ය.

19. සෑම බලපත්‍රලාභියෙකු විසින් ම බලපත්‍රය සහ බලපත්‍රයට අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ සේවා නියුක්තිකයන්ගේ නම් සහ ලිපිනයන් සිංහල හා දෙමළ භාෂාවලින් දැක්වෙන ලැයිස්තුවක් බලපත්‍රලාභි ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැළැස්විය යුතු ය.

20. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම දැන්වීමක්ම අවස්ථෝචිත පරිදි අයිතිකරු හෝ එම ස්ථානයේ භාරකරු වෙත භාර දිය යුතු ය. එවැන්නෙකු නොමැති විට බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි එල්ලා තැබිය යුතු ය. එවැනි දැන්වීමකට ස්ථානයේ අයිතිකරුගේ හෝ පරිහරණය කරන අයගේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවිය යුතු ය.

21. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කල හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොඩකවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් නගර සභාව අදහස් වේ.
"සභාපති " යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.
"නගර සභා බල ප්‍රදේශය" යන්නෙන් නගර සභාව සංස්ථාපනය වූ බල ප්‍රදේශය අදහස් වේ.
"බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙක් " යන්නෙන් සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ.
"බලපත්‍රධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.
"ව්‍යාපාර" යන්නෙන් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමක්, අළෙවිය සඳහා සූදනම් කිරීමක්, එක්රැස් කිරීමක් හෝ වෙළඳ අරමුණින් පවත්වාගෙනයාමක් අදහස් වේ.
"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ද අදහස් වේ.
"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙන්වෙන් යම් ව්‍යාපාරයක සංවිධානයක, පාලනය හෝ කළමණාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකු ද අදහස් වේ.

## *පළමුවන උපලේඛනය*

*පීඩාකාරී ව්‍යාපාර :*

1. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
2. සම් පදම් කිරීම.
3. සම් විකිණීම
4. සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)
5. ඡායාරූප ශාලාවක් පැවැත්වීම
6. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම
7. විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම
8. කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම
9. පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම
10. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
11. සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම
12. පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
13. සබන් නිෂ්පාදනය කිරීම
14. සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම
15. අළුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම.
16. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
17. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
18. වේවැල් භාණ්ඩ නිදවීම
19. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
20. සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම
21. රසකැවිලි වර්ග නිපදවීම
22. පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)
23. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)
24. දත් බුරුසු නිපදවීම
25. රා එකතු කිරීම
26. විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම
27. යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම
28. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
29. සෝඩා නිපදවීම
30. සම් භාණ්ඩ නිපදවීම
31. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම
32. මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාෂභෝග, කුළුබඩු හෝ කිරි පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම
33. ඉටිපන්දම් නිපදවීම
34. කපුරු නිපදවීම
35. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තින්ත නිපදවීම

36. රෙදි සෝදන නිල් නිපදවීම
37. ලාකඩ නිපදවීම
38. සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
39. පාසැල් රටහුණු නිපදවීම
40. ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
41. ටයර් නැවත පිරවීම
42. ටයර් ටියුබ් වොක්ලකනිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම
43. සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1000ට වැඩි ප්‍රමාණයක් ගඩබාකර තබා ගැනීම.
44. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බෙස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම
45. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම
46. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම
47. පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම
48. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම
49. ධාන්‍ය හෝ මාෂභෝග කිලෝ ග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගඩබාකර තබා ගැනීම

*දෙවන උපලේඛනය*

*අන්තරාදායක ව්‍යාපාර :*

1. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණක් ගබඩාකර තබා ගැනීම.
2. මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම
3. මුද්‍රණාලයක් පැවැත්වීම
4. කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම.
5. එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම.
6. ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම.
7. දර ගබඩාවක් පැවැත්වීම
8. කළු ගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්
9. සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
10. අයිස්ක්‍රීම් නිෂ්පාදනය
11. පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
12. ගිණිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
13. කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
14. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම.
15. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
16. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම
17. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම
18. හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කර තබා ගැනීම.
19. පා පැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ වැඩපළක් පැවැත්වීම
20. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම
21. විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
22. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගඩබා කිරීම හෝ නිපදවීම
23. පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
24. ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම
25. දැව ගබඩා කිරීම.

*තෙවන උපලේඛනය*

*පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර :*

1. රාසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම
2. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම
3. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම
4. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම ස්ථානයක් පැවැත්වීම
5. හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම

6. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
7. මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
8. මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
9. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම
10. බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම
11. ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
12. ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම.
13. වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම
14. ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම.
15. කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම.
16. වැල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම.
17. ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපළක් පැවැත්වීම.
18. පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛණිජතෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම.
19. කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම.
20. වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
21. විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අළුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම
22. කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම

### හෝටල් හා ලැගුම්හල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ හෝටල් හා ලැගුම්හල් විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සඳහා පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ හෝටල් හා ලැගුම්හල් පිළබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභා ප්‍රදේශය තුළ හෝටලයක් හෝ ලැගම්හලක් (මෙහි මින් මතු ''ස්ථානය'' වශයෙන් හඳුන්වනු ලබන) පවත්වාගෙන යාම නොකළ යුතු ය.

4. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

5. බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන ස්ථිර ඉදිකිරීම් නගර සභාවේ සභාපති විසින් ස්ථානය අනුමත සැළැස්මකට අනුකුල ඉදිකරන ලද ඉදිකිරීමක් විය යුතු ය.

6. මෙම අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ හෝටලයකට හෝ ලැගුම්හලකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(1) ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(2) ස්ථානයේ සෑම කාරමයක ම බිත්ති මීටර් 2.5කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර, එකී බිත්ති ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය. එසේ වුවද මුළුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකුලවන ලෙස සැලකිය යුතු ය.

(3) ස්ථානයේ සෑම කාමරයකටම සීලිමක් බැගින් සවිකර තිබිය යුතු අතර එකී සීලිම පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(4) සෑම කාමරයකටම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ ජනෙල්වල කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ගඵලයෙන් පහලොවෙන් එකකට නොඅඩු විය යුතු ය. එසේ වුවද කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවකදී මේ නියමය අදාළ නොවිය යුතු ය.

(5) වහලය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු ය.

(6) පියසි කෙලවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2කට උසින් පිහිටා තිබිය යුතු අතර අගු වාසිය අවම වශයෙන් මීටර් 1.5ක් විය යුතු ය.

(7) සෑම කාමරයකම බිම සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(8) ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර සියළු කසළ භාජන මැස්සන් හෝ වෙනත් කෘමි සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.

(9) ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවෙහි නියමයක් අනුව ක්‍රියාකළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(10) ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(11) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම් එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(12) ගණුදෙනුකරුවන් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය.

(13) ගණුදෙනුකරුවන්ගේ සහ සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුට එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතු ය.

(14) සෑම වැසිකිළියක හෝ කැසිකිළියකම බිත්ති ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් කබුක් ගලෙන් හෝ මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තනා බිම සිමෙන්තියෙන් කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. එසේම තවදුරටත් ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් කලෙන් තැනූ බිත්ති වන විට ඒවා කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු වන අතර මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තැනූ බිත්ති වන විට ඒවා මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(15) ස්ථානයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා නාන කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර ඉහත (14) වන උපවගන්තියේ සඳහන් වැසිකිළිවලට අදාළ නියමයන් එකී නාන කාමරවල බිමට සහ බිත්ති වලට අදාළ විය යුතු ය.

(16) ස්ථානයේ ගණුදෙනුකරුවන්ගේ පාවිච්චියට වෙන් කළ කොටස තුළ, ගණුදෙනුකරුවන්ගේ අත් සේදීමට මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔප දැමූ හෝ ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්ලූ බේසම් තනා තිබිය යුතු ය.

(17) ස්ථානයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අප ජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් සකස් කර තිබිය යුතු ය.

(18) නගර සභාව විසින් ජලාපවහන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන්නේ නම් ස්ථානයෙන් බැහැර කරන අප ජලය නගර සභාව විසින් නියම කරනු ලබන ආකාරයෙන් එකී ජලාපවහන පද්ධතියට ගලායාමට සැලැස්විය හැකි අතර එසේ නොවන අවස්ථාවක එකී අප ජලය උරා ගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතු ය.

(19) ස්ථානය සඳහා ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර ස්ථානයට අදාල ගිණි ආරක්ෂණ සහතිකයක් ලබා තිබිය යුතු ය.

(20) ස්ථානයේ ගණුදෙනුකරුවන්ට හා සේවකයන්ට නිදාගැනීමට වෙන් කළ නිදන කාමරවල එක් තැනැත්තෙකුට නිදා ගැනීමට වෙන් කළ ඉඩ ප්‍රමාණය අවම වශයෙන් මීටර් හතරකට නොඅඩු විය යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළ යුතු අතර අප ජලය බැසයන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර ජලයෙන් සෝදා හැරීම කළ යුතු ය.

8. බලපත්‍රලත් ස්ථානයෙහි නිදන කාමර වශයෙන් නිශ්චිත වෙන් කර ඇති කාමරයක හැර වෙනත් කිසියම් කාමරයක කවර හෝ තැනැත්තෙකුට නිදා ගැනීමට ඉඩදීම නොකළ යුතු ය.

9. බලපත්‍රලත් ස්ථානයෙහි කාමර පහසුකම් ලබා ගනු ලබන එක් එක් තැනැත්තාගේ නම, ලිපිනය හා අනන්‍යතාවය සටහන් කරන ලේඛණයක් සෑම බලපත්‍රලත් ස්ථානයකම පවත්වා ගත යුතු අතර සභාපතිවරයා, බලයලත් නිලධාරියා හෝ කිසියම් පොලිස් නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීමට ඉල්ලා සිටින අවස්ථාවකදී එකී ලේඛනය පරීක්ෂා කිරීමට ඉඩදීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

10. බලපත්‍රලත් ස්ථානයේ සෑම නිදන කාරමයකම එක් ගනුදෙනුකරුවෙකු විසින් පාවිච්චි කරනු ලැබීමෙන් අනතුරුව තවත් ගණුදෙනුකරුවකුගේ පාවිච්චියට ඉඩදීමට පෙර එකී නිදන කාරමයේ ඇඳ ඇතිරිලි, කොට්ට උර, පොරෝනා, තුවා සහ පාවිච්චි කළ වෙනත් රෙදි සෝදා පිරිසිදු කිරීමෙන් අනතුරුව මිස අනෙක් ගණුදෙනුකරුවෙකුගේ පාවිච්චියට සැළැස්වීම නොකළ යුතු මෙන්ම පසුව පැමිණෙන ගණුදෙනුකරුවාට එකී කාමරයට පාවිච්චි කිරීමට ඉඩදීමට පෙර එකී කාමරයේ ජනේල අවම වශයෙන් පැය හතරක් වත් සම්පූර්ණයෙන් විවෘත කර තැබීමට සැලැස්විය යුත ය.

11. බලපත්‍රලත් ස්ථානයේ කිසියම් නිදන කාමරයක, ආහාර පිළියෙල කරනු ලබන ස්ථානයක හෝ ආහාර ගැනීමට වෙන්කළ කිසියම් කොටසක කවර හෝ සත්ත්වයෙකු තබා ගැනීම නොකළ යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ ඇති වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කළ යුතු අතර දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වා ගත යුතු අතර, එසේ වුවද ගණුදෙනුකරුවන් නවාතැන් ගන්නා කිසියම් කාරමයක වැසිකිළි දිනකට එක් වරක් පිරිසිදු කිරීම ප්‍රමාණවත් ලෙස සැලකිය හැකිය.

13. බලපත්‍රලත් ස්ථානයේ ආහාර පාන පිළියෙල කිරීමට, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට සහ ගණුදෙනුකරුවන්ගේ පාවිච්චියට ගනු ලබන භාණ්ඩ, භාජන හා උපකරණ සෑම එකක්ම ඒවා පාවිච්චියට ගැනීමට පෙර පිරිසිදු ජලයෙන් සෝදා ගත යුතු අතර පාවිච්චි කිරීමෙන් පසුව සෝදා පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

14. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතුවන සියළුම කසළ මෙම අතුරු ව්‍යවස්ථාවෙහි 16 වැනි වගන්තියෙහි නියම කර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යයකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු අතර එකී කසළ අවම වශයෙන් එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර එකී භාජනාවලට කසළ බහාලන අවස්ථාවේදී හා ඉවත් කිරීමේදී හැර අන් සියළු වේලාවන් වලදී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

15. බලපත්‍රලත් ස්ථානයෙන් ඉවත දමන කසළ කවර හෝ අවස්ථාවක ස්ථානයේ බිම හෝ තැනින් තැන දැමීම නොකළ යුතු ය.

16. (1) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියළුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය
(ii) වීදුරු
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය
(iv) පොලිතීන් හෝ ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්
(vi) නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන වෙනත් අමුද්‍රව්‍ය වලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්
(vii) අන්තරායකර අපද්‍රව්‍ය

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(2) ඉහත උපවගන්තියෙහි සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකි වල දමා ඇති අපද්‍රව්‍ය නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

17. සෑම බලපත්‍රලත් ස්ථානයක්ම මීයන්ගෙන්, මැස්සන්ගෙන් හෝ වෙනත් කෘමින්ගෙන් තොරව පවත්වා ගත යුතු අතර එකී ස්ථානයේ තබා ගන්නා ආහාර පාන පිළියෙල කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය හා පිළියෙල කළ ආහාර පාන එකී සතුන්ගෙන් දූෂණය වීම වැළැක්වීමට අවශ්‍ය සියලුම විධිවිධාන සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

18. ගණුදෙනුකරුවන්ට ආහාර පිළිගැන්වීමේදී ඒවා අතින් ඇල්ලීම නොකළ යුතු අතර එකී ආහාර පිළිගැන්වීම සඳහා හැන්දක් හෝ ගැරුප්පුවක් හෝ වෙනත් ආකාරයක උපකරණයක් යොදා ගත යුතු ය.

19. (1) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(2) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(3) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

20. බලපත්‍රලත් ස්ථානයේ ආහාර හෝ පාන පිළියෙල කිරීමේ නියුක්ත සෑම සේවකයෙකු වෙතම පිළිවැසුම් සපයා තිබීමත්, එකී සේවකයන් කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවකම එකී පිළිවැසුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

21. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහාම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

22. බලපත්‍රලත් ස්ථානයක් අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ පවති ද යන්න පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ සභාපතිවරයාගෙන් බලයලත් නිලධාරියෙකු එකී ස්ථානයට ඇතුල්වීම හෝ ඇතුල්වී පරීක්ෂා කිරීම නීත්‍යානුකූළ වන්නේ ය.

23. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයක පිළියෙල කරන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

24. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් හෝටලයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය මෙම අතුරු ව්‍යවස්ථාවෙහි 6 වන වගන්තියෙහි සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයන්ට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

25. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

26. මෙම අතුරු ව්‍යවස්ථාවල පද සම්බන්ධය අන්‍යාර්ථයක් අවශ්‍ය වූවහොත් මිස,

"සභාව" යන්නෙන් නගර සභාව අදහස් වේ.
"සභාපති " යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.
"නගර සභා බල ප්‍රදේශය" යන්නෙන් නගර සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය අදහස් වේ.

## ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. නගර සභාවට අයත් සෑම ආදාහනාගාර මෘත ශරීර ආදාහනය කිරීම, ඒ සඳහා ගාස්තු අය කිරීම සහ ආදාහනාගාර පාලනය විධිමත් කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ අදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලිඛිතව බලය පවරන ලද නිලධාරියෙකු (මෙහි මින්මතු "බලයලත් නිලධාරී" ලෙස සඳහන් කරන) විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව සභාව සතු ආදාහනාගාරයක මෘත ශරීරයක් ආදාහනය නොකළ යුතු ය.

4. 3 වන වගන්තියේ සඳහන් අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන (මෙහි මින්මතු "ඉල්ලුම්කරු" යැයි සඳහන් කරනු ලබන) තැනැත්තෙකු විසින් "අ" උපලේඛනයට සාරානුකූලව පිළියෙළ කරන ලද ඉල්ලුම් පත්‍රයක් පහත සඳහන් ලියවිලි සමග සභාපතිවරයා වෙත හෝ ඔහුගේ බලයලත් නිලධාරියෙකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :–

   (අ) මියගිය තැනැත්තා සහ ඉල්ලුම්කරු අතර සම්බන්ධතාව තහවුරු කරන ලියවිල්ලක් ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකය හෝ මියගිය අයගේ උප්පැන්න සහතිකය හෝ ඉල්ලුම්කරුගේ විවාහ සහතිකය හෝ මියගිය තැනැත්තා පදිංචි සිටි ග්‍රාම සේවා කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකයක් මේ සඳහා ප්‍රමාණවත් වේ.)

   (ආ) මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහ පනත යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, පරීක්ෂණය පවත්වන ලද මරණ පරීක්ෂකවරයා හෝ මහේස්ත්‍රාත්වරයා විසින් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41(ඉ) ඡේදය යටතේ මෘතශරීරය ආදාහනය කිරීම සඳහා අවසර දෙමින් නිකුත් කරන ලද සහතිකය හෝ අජීවී උපතකින් බිහි කරන ලද මෘත ශරීරයක් නම්, උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 43(ආ) ඡේදය යටතේ නිකුත් කරන ලද සහතිකය ;

5. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු වෙත භාරදෙනු ලැබීමෙන් පසු ලැබුණ අනුපිළිවෙල අනුව ලේඛන ගත කළ යුතු වේ.

6. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා භාර ගනු ලබන්නේ නම් ඒ සඳහා නියමිත ගාස්තුව අයකර ගෙන අවසර පත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. අදාහනාගාර භාරකරු වෙත මෘත ශරීරය භාර දිය යුතු වේලාව අවසර පත්‍රයෙහි සඳහන් කළ යුතු ය.

7. මෘත ශරීරය ආදාහනය සඳහා භාරගනු නොලබන්නේ නම්, ඒ බව අවස්ථාවෝචිත පරිදි සභාපතිවරයාගේ බලයලත් නිලධාරියා ඒ බව, එයට හේතු වූ කරුණු සහිතව වහාම ඉල්ලුම්කරුවා හට දැන්විය යුතු ය.

8. සෑම දිනකම පෙ. ව. 07.00 සිට ප. ව. 08.00 දක්වා කාලය ඇතුළත ආදාහනය කිරීමක් සඳහා මෘත ශරීර භාර ගනු ලැබිය හැක.

9. ඉල්ලුම්කරු අවසර පත්‍රයේ නිරූපිත වේලාවට හෝ එයට ප්‍රථම ආසන්න විනාඩි තිහක කාලයක් තුළ මෘත ශරීර ආදාහනාගාර භාරකරුට භාර දිය යුතු ය. ප්‍රමාද වී භාරදීම හේතුවෙන් ඇතිවන අපහසුතාවය හෝ අලාභ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වගකීමට යටත් නොවිය යුතු ය.

10. සෑම ආදාහනාගාරයක ම ආදාහනය කරන ලද එක් එක් මෘත ශරීරය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, මියගිය අයගේ නම, ඔහු මියයාමට ප්‍රථම පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය හා ඉල්ලුම්කරු හා මියගිය තැනැත්තා අතර තිබූ සම්බන්ධතාවය ආදාහනය සිදු කරන ලද දිනය හා වේලාව හා අවසර පත්‍රයේ අංකය සහ දිනය ආදාහනාගාර භාරකරු විසින් ලේඛන ගත කරනු ලැබිය යුතු ය.

11. මෘත ශරීරය ආදාහනය කර පැය 72 ගත වීමට ප්‍රථම ඔහුගේ නියෝජිතයා භෂ්මාවශේෂ භාර ගත යුතු ය. එසේ වුව ද සභාපතිට හෝ බලයලත් නිලධාරියාට ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමක් මත භෂ්මාවශේෂ ආදාහනාගර භාරකරුගේ භාරයේ තබා ගන්නා කාල සීමාව දීර්ඝ කරනු ලැබේ. නියමිත කාලය ඇතුළත් භාරගනු නොලබන භෂ්මාවශේෂ බැහැර කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියකුට බලය තිබිය යුතු ය.

12. ආදාහනාගාර භාරකරුගේ හෝ සභාපතිවරයාගේ අවසරය නොමැතිව ආදාහනාගාර පරිශ්‍රයට ඇතුල් වීම වරදක් වන්නේ ය. එසේ වුවද, මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අවසර පත්‍ර ලාභියකු සමග පැමිණෙන තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ඒ සඳහා අවසර දී ඇති ලෙස සළකනු ලැබිය යුතු ය.

13. ආදාහනාගාර පරිශ්‍රය තුළ සාමය කඩවන ආකාරයට හැසිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ පිහිටි සභාව සතු දේපළ වලට අලාභහානි කිරීම හෝ ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයන්ගේ හෝ රාජකාරී කටයුතු වලට බාධා කිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ සැරසිලි කිරීම වරදක් වන්නේ ය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටෙක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

15. (1) මෘත ශරීර ආදාහනය කිරීමට සුදුසු තත්ත්වයකින් ආදාහනාගාර නඩත්තු කිරීම සභාපතිවරයාගේ කර්තව්‍ය විය යුතු ය.

(2) ආදාහනාගාරයක් නඩත්තු කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කිසියම් කාලයක් තුළ වසා තබනු ලබන්නේ නම් ඒ පිළිබඳ නිවේදනය ආදාහනාගාරයේ සහ ආදාහනාගාරයට අවසර පත් නිකුත් කරනු ලබන කාර්යලයක ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කරවීම සභාපතිවරයාගේ කර්තව්‍ය විය යුතු ය.

16. (1) මෘත ශරීර ආදාහනය කිරීම සඳහා අයකර ගත යුතු ගාස්තු නගර සභාවේ යෝජනා සම්මතයක් මඟින් කලින් කලට පනවනු ලැබිය හැකිය. එසේ පනවනු ලබන ගාස්තු නගර සභාව අවශ්‍ය යැයි සළකනු ලැබූ අවස්ථාව වලදී සංශෝධනය කළ හැකිය.

(2) ඉහත (1) වන ඡේදය යටතේ පළවන හෝ සංශෝධනය කරනු ලබන ගාස්තු ගැසට් පත්‍රය මගින් නිවේදනය කළ යුතු ය.

17. ආදාහනාගාරය ක්‍රියාත්මක වෙමින් පවතින මොහොතක අනපේක්ෂිතව හට ගන්නා යාන්ත්‍රික දෝෂයක දී ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කිරීමේ බලය සභාපතිවරයා සතු වන අතර එවැනි තත්ත්වයක් කවර ආකාරයකින් හෝ ඉල්ලුම්කරුට සභාවට හෝ සභාපතිවරයාට එරෙහි ක්‍රියාමාර්ගයක් සඳහා කරුණක් නොවිය යුතු ය.

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

"සභාව" යන්නෙන් නගර සභාව අදහස් වේ.
"සභාපති" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.
"ආදාහනාගාර භාරකරු" යන්නෙන් සභාව සතු ආදානාගාරයක භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා පත්කර ඇති තැනැත්තෙකු අදහස් වේ.
"මෘත ශරීරය" යන්නෙන් මනුෂ්‍යකුගේ මෘත ශරීරිය හෝ මෘත ශරීරයකින් කොටසක් හෝ අජීවී උපතකින් බිහි කරන ලද සිරුරක් ද ඇතුළත් වේ.

*"අ" උපලේඛනය*

*........................................ආදාහනාගාරයේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :———.
ලිපිනය :———.
ජාතික හැඳුනුම්පත් අංකය :———.
ග්‍රාම සේවා කොට්ඨාසය :———.

02. මියගිය තැනැත්තාගේ නම :———.
පදිංචි වී සිටි ලිපිනය :———.
ග්‍රාම සේවා කොට්ඨාසය :———.
ජාතික හැඳුනුම්පත් අංකය :———.

03. මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ සම්බන්ධය :——— .

04. මරණ සහතිකයේ අංකය හා දිනය :——— .

05. මරණ ලියාපදිංචි කළ ලේකම්ගේ නම හා ලිපිනය :——— .

06. මරණයට හේතුව :——— .

07. මරණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම් දිනය හා වේලාව :——— .

08. පරීක්ෂණ නිලධාරියාගේ නම හා තරාතිරම :——— .

09. පරීක්ෂණ නිලධාරියාගේ නිගමනය :——— .

10. මෘත ශරීරය ආදාහනය කිරීමට අවසර ලබා දෙන්නේ ද යන වග :——— .

11. ආදාහනය කිරීමට අවශ්‍ය දිනය හා වේලාව :——— .
(කැමැත්තේ අනුපිළිවෙල අනුව)

i. ....................................
ii. ....................................
iii. ....................................

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල නිවැරදි හා සත්‍ය බව සහතික කරමි. අදාළ සහතික අමුණා ඇත.

...............................................
අයදුම්කරුගේ අත්සන හා දිනය.

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි**

1. අවසර පත්‍රය නිකුත් කිරීම අනුමත කරමි. පහත සඳහන් හේතුමත අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමි.

....................................
....................................
....................................

................................
අත්සන,
සභාපති/බලයලත් නිලධාරී.

දිනය :.................................................

සභාපති/බලයලත් නිලධාරී,

1. ලේඛනයේ සටහන් කරන ලදී
....................................දින අංක .................................... දරන ලදුපතින් රු.....................................ක් අය කර ගන්නා ලදී.

2. අවසර පත්‍රය සඳහා ඉදිරිපත් කරමි.

3. ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු ඇතුළත් ලිපිය අත්සන සඳහා ඉදිරිපත් කරමි.

......................................................
විෂයභාර නිලධාරියාගේ අත්සන,

දිනය :.............................

### භෝජනශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ භෝජනශාලා විධිමත් කිරීම හා අධීක්ෂණය කිරීම පාලනය කිරීම සඳහා පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව භෝජනාශාලා අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

3. සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභා ප්‍රදේශය තුළ භෝජනශාලාවක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

4. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

5. මේ අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් කොන්දේසි ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ භෝජනශාලාවකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

   (1) භෝජනශාල සඳහා වන සියළු ස්ථිර ඉදිකිරීම් සභපතිවරයා විසින් අනුමත කර ඇති සැළැස්මකට අනුකූලව ඉදිකර තිබිය යුතු ය.

   (2) ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන තිබිය යුතු ය.

   (3) ස්ථානයේ සෑම කාමරයකම බිත්ති මීටර් 2.5කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර එකී බිත්ති ස්ථිර ලෙස තනා තිබිය යුතු අතර දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය.

   (4) භෝජන ශාලාවෙහි අභ්‍යන්තර පරිශ්‍රයෙහි සෑම කාමරයක්ම සීලිමක් බැගින් සවිකර තිබිය යුතු අතර එකී සීලිම පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5 කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

   (5) සෑම කාමරයකටම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ ජනේලවල කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ගඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතු ය. එසේ වුවද කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවකදී මෙකී විධිවිධාන එලෙසින්ම අදාළ නොවිය හැකිය.

   (6) වහලය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු ය.

   (7) භෝජනශාලාවෙහි බිම සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

   (8) භෝජනශාලා පරිශ්‍රය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර එකී කසළ භාජන මැස්සන් හෝ වෙනත් කෘමි සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් සහිත විය යුතු ය.

   (9) භෝජනශාලා පරිශ්‍රය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ මතු දැක්වෙන නියමයන් අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

   (10) භෝජනාශාලා පරිශ්‍රය තුල පාවිච්චි කරන ගෘහ උපකරණ මනා නිමවුමක් සහිත විය යුතු අතර මේස හා පුටු ආදිය ලීයෙන් හෝ ලෝහයෙන් තනා ඔප දමා හෝ මේස වීදුරු තහඩුවක් යොදා තිබිය යුතු ය.

   (11) පාරිභෝගිකයින් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය.

   (12) ගණුදෙනුකරුවන්ගේ සහ සේවකයන්ගේ පාවිච්චිය සඳහා ප්‍රමාණවත් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිලි තනා තිබිය යුතු ය.

   (13) පාරිභෝගිකයින්ගේ පාවිච්චියට වෙන් කළ කොටස තුළ, ගණුදෙනුකරුවන්ගේ අත් සේදීමට මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔප දැමූ හෝ ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්ලූ බේසම් තනා ජල පහසුකම් සපයා තිබිය යුතු ය.

(14) ස්ථානයේ කවර හෝ කොටසක් පාවිච්චියෙන් පසු බැහැර කරන අප ජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇති කර තිබිය යුතු ය. කිසි විටකත් කාණු පොදු ප්‍රවේශයකට මුදා නොහැරිය යුතු ය.

(15) ස්ථානයේ ප්‍රමාණවත් ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.

(16) ස්ථානයේ තේ, කෝපි හෝ කිරි පිළියෙල කරනු ලබන කොසට පිරිද්දුම් නැති මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ආවරණය කර තිබිය යුතු ය.

6. භෝජනශාලාව ඊට අදාළ සියළු පරිශ්‍රයන් තීන්ත ආලේප කර මනා තත්වයෙන් පවත්වා ගැනීම බලපත්‍රලාභීයාගේ කාර්යය වන්නේ ය.

7. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළ යුතු අතර අප ජලය බැසයන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර ජලයෙන් සෝදා හැරීම කළ යුතු ය.

8. භෝජනශාලා පරිශ්‍රය තුළ සුරතලය සඳහා බල්ලන් හෝ පූසන් වැනි සතුන් ඇති නොකළ යුතු ය.

9. භෝජනශාලාවේ ඇති වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කළ යුතු අතර දූර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වා ගත යුතු ය.

10. භෝජනාශාලාවෙහි ආහාර රඳවනයන් හා ආහාර ඇල්ලීම සඳහා නිශ්චිත මෙවලම් පාවිච්චි කළ යුතු අතර, ඒ සියල්ල මනා ලෙස පිරිසිදු කර තබා ගත යුතු ය.

11. (අ) භෝජනශාලා පරිශ්‍රය තුළ ජනනය වන සියළුම අප ද්‍රව්‍ය

i. ජෛවහානය අපද්‍රව්‍ය
ii. වීදුරු
iii. කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය
iv. පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය
v. යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් වශයෙන් වෙන් වෙන්ව එක් රැස් කළ යුතු ය.

භෝජනශාලා තුළ ඉහත උපවගන්තියෙහි වූ ක්‍රමවේදයන් යටතේ එක් රැස්වන කසල බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන කසල කළමනාකරණ වැඩසටහනකට අනුකූලව අවසන් බැහැර කිරීම සඳහා කටයුතු කළ යුතු ය.

12. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ භෝජනාශාලාවක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් භෝජනශාලාවේ කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභීයාගේ කාර්යය විය යුතු ය.

13. බලපත්‍රලත් ස්ථානයේ ආහාර පාන පිළියෙල කිරීමේ නියුක්ත සෑම සේවකයෙකු සඳහාම වෙන වෙනම පිළිවැසුම් සපයා තිබීමත්, එකී සේවකයන් කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවකම එකී පිළිවැසුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභීයාගේ කාර්යය විය යුතු ය.

14. සභාපතිවරයා හෝ සභාපතිවරයාගේ බලයලත් නිලධාරියෙකු විසින් භෝජනශාලාවක පිළියෙල කරන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

15. සභාපතිවරයා හෝ සභාපතිවරයා තත්කාර්ය සඳහා බලය දෙනු ලැබූ නිලධරයකු හෝ භෝජනශාලාවකට ඇතුළු වී එය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන අතර, එම ස්ථානයට ඇතුළු වී එය පරීක්ෂා කිරීමට බලපත්‍රධාරියා හෝ එය භාරව සිටින තැනැත්තා හෝ ඉඩ දිය යුතු අතර හැකි සියළු සහය ලබා දිය යුතු ය.

16. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන විධිවිධාන උල්ලංඝනය වන පරිදි භෝජනශාලාවක් පවත්වාගෙන යාමේ දී හා එකී උල්ලංඝනය පිළිබඳ සභාපතිවරයා විසින් දැනුම් දීමක් කරනු ලැබූ විටකදී, එහි දැනුම් දීම යටතේ නිවරැදි වීම සඳහා ලබා දී ඇති කාලසීමාව තුළ නිවැරදි නොවුනු අවස්ථාවකදී නිකුත් කර ඇති බලපත්‍රය සභාපතිවරයා අවලංගු කිරීම නීත්‍යානුකුල වන්නේ ය.

17. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයකින් තොරව භෝජනශාලාවක් පවත්වාගෙන යාම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණය මගින් වරදකරු කිරීමෙන් අනතුරුව ආඥා පනතේ 153 නගර සභා පනතේ වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියමකර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දන්ඩණයේ උපරිමය විය යුතු ය.

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ.

"සභාපතිවරයා" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා ද
"බලයලත් නිලධාරියා" සභාපතිවරයා වෙතින් නිශ්චිත කර හෝ පොදුවේ යම් කාර්යයක් සඳහා බලය දී ඇති නිලධාරියකු අදහස් විය.

## මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳවද ඒ සඳහා ගාස්තු අය කිරීම සඳහා ද පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. නගර සභා බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව මාළු විකිණීමේ කාර්යය සඳහා යම් ස්ථානයක් පාවිච්චි නොකළ යුතු ය.

4. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රය ලබා ගැනීමට ඉල්ලුම් කරන වෙළඳ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ තැනැත්තෙකුට මාළු විකිණීමේ වෙළඳ ස්ථානයක් පවත්වා ගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(අ) මාළු විකිණීම සඳහා ම ප්‍රදර්ශනය කරනු ලබන කොටස පිඟන් ගඩොල් කපරාරු කළ සිමෙන්ති හෝ මළ නොබැදෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතු ය.

(ආ) මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම සිමෙන්ති බදාමයෙන් මැදීම කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(ඇ) අප ජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්ලු කාණු තිබිය යුතු ය.

(ඈ) (3) ඡේදයේ සඳහන් කාණු තුළින් ගලායන අප ජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාමට වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී අප ජලය උරා ගන්නා වළකට ගලායාමට ඉඩ සලස්වා තිබිය යුතු ය.

(ඉ) අප ජලය ගලා යාමට සලස්වන ලද උරාගන්නා වල වාතයට නිරාවරණය නොකළ යුතු ය.

(ඊ මාළු වෙළඳ ස්ථානයෙන්, බැහැර කරන ලබන ජෛවභායන අප ද්‍රව්‍ය බහා ලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළඳාම් කටයුතු අවසානයේ එකී අප ද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 0.5ක් ගැඹුරෙන් වළ දැමීම හෝ ප්‍රාදේශීය සභාව විසින් කළින් කළ තීරණය කර ක්‍රියාත්මක කරන ආකාරයට බැහැර ලීම් කළ යුතු ය.

5. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිමද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලු හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද මාළු කැපීම සඳහා ගන්නා කොට ද, උපකරණ ද, මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන ද, විෂ බීජ නාශක දියර යොදා සෝදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

6. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක සහ එහි අවට කාණු ද, මාළු ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියලු භාජන සහ උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මාළු අධි ශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මාළු වෙළඳ සැල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුණේ නම් මිස ශේෂවන කවර හෝ මාළු ඊළඟ දිනයේ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධි ශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබා ගැනීම හෝ නොකළ යුතු ය.

8. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන්, කෘමීන් හෝ වෙනත් කවර හෝ සතුන්ගෙන් තොරව තබා ගත යුතු ය.

9. බලපත්‍රලත් ස්ථානයෙහි මාළු දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර කිසිම භාණ්ඩයක් හෝ ඇඳුමක් හෝ නිදාගන්නා පැදුරක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතු ය.

10. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ මාළු වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක වෙළඳාමෙහි හෝ එසේ වෙළඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මාළු වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) මාළු වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

11. මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවකම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහ සහතිකවීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම විසින් ප්‍රයෝජනයට ගැනීම පිණිස සබන් හෝ සබන් දියර තබා තිබීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් මාළු වෙළඳ ස්ථානයෙහි විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ඇතුළත ගබඩා කර ඇති යම් මාළු වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

14. (1) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය

(i) ජෛවභායන අපද්‍රව්‍ය
(ii) වීදුරු
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේදී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්
(vii) අන්තරායකර අප ද්‍රව්‍ය

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලීමට පිළියෙළ කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(2) ඉහත (1) උපවගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අප ද්‍රව්‍ය නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට මාළු වෙළඳ ස්ථානයේ මාළු වෙළඳාම කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

16. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තියෙහි සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල හෝ වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූලව තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

17. ඉහත වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුවද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලැබෙන කාලය දින දහ හතරකට නොවැඩිය යුතු ය.

18. 16 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

20. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් නගර සභාව අදහස් වේ.
"සභාපති" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.
"නගර සභා ප්‍රදේශය" යන්නෙන් නගර සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය අදහස් වේ.

### සභා බල ප්‍රදේශයේහි මාර්ගවල වාහන පාලනය කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව

1. නගර සභා බල ප්‍රදේශය තුළ නගර සභා මාර්ගයන්හි වාහනවල බර සහ වේග සීමා නියම කිරීම, එමගින් පාරකට හෝ මංමාවතකට ඇතිවිය හැකි අලාභ සිදුවීමට ඉඩ ඇති අවස්ථාව අවම කිරීම හා ගමනාගමන පාලනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා මාර්ගයන්හි බර සහ වේග සීමා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. නගර සභාව විසින් නගර සභා බල ප්‍රදේශයේ, නගර සභාව සතු පාරවල් හෝ මංමාවත් අතරින්, නගර සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන යම් පාරක් හෝ මංමාවතක් සම්බන්ධයෙන් එකී පාරේ හෝ මංමාවතේ ධාවනය විය යුතු වාහනයක බර හා වේගයෙහි උපරිමය සභා සම්මුතියක් මගින් තීරණය කර නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

4. ඉහත 3 වගන්තියේ සඳහන් නියමයන්, නගර සභාවේ සභාපති විසින් එකී පාර හෝ මංමාවත ආරම්භක ස්ථානයෙහි, අවසන් වන ස්ථානයෙහි, ප්‍රවිෂ්ඨ වන ප්‍රධාන ස්ථානයන්හි මහජනයාට දැකගත හැකිවන පරිදි දැන්වීම් පුවරුවක් හෝ පුවරු මගින් ප්‍රදර්ශනය කළ යුතු වන්නේ ය.

5. මෙහි ඉහත 4 වගන්තියෙහි සඳහන් නියමයන් සිදු කිරීමේදී මංමාවත් ආඥාපනතේ සහ ගමනාගමන ආඥා පනතේ වන නියමයන්ට සාරානුකූලව අදාළ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කළ යුතු වන්නේ ය.

6. නගර සභාව සතු පාරක් හෝ මංමාවතක් ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් හෝ ඉදි කිරීමකදී නගර සභාවේ සභාපතිවරයා විසින් දින තුනකට පෙරාතුව සිදුකරන පූර්ව දැනුම්දීමකින් පසුව, එකී පාර හෝ මංමාවත හෝ එකී පාරකින් හෝ මංමාවතකින් කොටසක් වසා දැමීම හෝ ගමනාගමනය සීමා කිරීම නගර සභාවේ සභාපති විසින් සිදුකළ හැක.

7. නගර සභාව සතු පාරක් හෝ මංමාවතක් දෙපස පදිංචිකරුවන් විසින් පාරට හෝ මංමාවතට අප ජලය කිසිදු අයුරකින් ගලා ඒම සිදු නොකළ යුතු ය.

8. නගර සභාව සතු පාරක් හෝ මංමාවතක් දෙපස පදිංචිකරුවන් විසින් පාරට හෝ මංමාවතට කිසිදු අයුරකින් අවහිරවන හෝ බාධාවන පරිදි ගස්වල අතු නෙරා ඒම වැලැක්විය යුතු ය.

9. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හො උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

මේ යටතේ අයකරනු ලබන සියලුම මුදල් දඩ මුදල් නගර සභාවේ අරමුදලට බැර කළ යුතු ය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයන් අවශ්‍ය වූවහොත් මිස

"සභාපති" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.
"මංමාවත හා පාර" යන්නෙන් මහජනයාට මාර්ග අයිතිවාසිකම් ඇත්තාවූ ද, සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් නගර සභාව විසින් අළුත්වැඩියා කරන්නා වූ හෝ නඩත්තු කරන්නා වූ අළුත්වැඩියාකර ඇත්තා වූ හෝ නඩත්තු කර ඇත්තා වූ නගර සභා බල ප්‍රදේශය තුළ පාරක් හෝ මංමාවතක් අයත් වේ.
"වාහනය" යන්නෙන් මෝටර් වාහන ආඥාපනත යටතේ දී ඇති අර්ථයම අදහස් වේ.

## සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව

1. නගර සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළඳාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළඳාම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නගර සභාවේ, සභාපතිවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ මිස කිසිම තැනැත්තෙකු විසින් නගර සභා බල ප්‍රදේශය තුළ යම් පාරක, මංමාවතක, පොදු උද්‍යානයක, ක්‍රීඩාංගනයක හෝ වෙනත් යම් පොදු ස්ථානයක යම් කවර හෝ භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ආහාරයක් අතින් රැගෙන ගොස් බයිසිකලයක, ට්‍රයිසිකලයක, කරත්තයක හෝ වෙනත් යම් වාහනයක එහා මෙහා රැගෙන යමින් විකිණීම හෝ විකිණීම සඳහා තබා නොගත යුතු ය.

4. ඉහත 3 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක් කලින් අවලංගු නොකරනතාක් නිකුත් කරනු ලැබුවේ යම් කාල සීමාවක් සඳහා ද එකී කාල සීමාවක් සඳහා ද එකී කාල සීමාව සඳහා පමණක් වලංගු වෙයි.

5. සංචාරක වෙළඳාමට අදාළ අවසර පත්‍රයක් සඳහා වන සෑම ඉල්ලීමක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේහි "අ" උපලේඛනයට සාරානුකූලව පිළිවෙල කරන ලද ඉල්ලුම්පත්‍රයකට අනුකූල විය යුතු ය. එය නගර සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තු ගෙවා ලබාගත යුතු ය.

6. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ "ආ" උපලේඛනයට සාරානුකූල විය යුතු අතර ඒ සඳහා අය කළ යුතු ගාස්තු කාල පරිච්ඡේදයන් සැළකිල්ලට ගනිමින් සභාව විසින් කලින් කළ තීරණය කළ හැකිය.

7. සෑම සංචාරක වෙළෙන්දෙකුම වෙළෙඳ කටයුතුවල නිරත වන විට දී සභාපතිවරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයෙහි ප්‍රකටව පෙනෙන පරිදි පැළඳ සිටිය යුතු හෝ ප්‍රදර්ශනය වන පරිදි තැබිය යුතු කොටස එලෙසින් තබා ගැනීම කාර්යය විය යුතු ය.

8. සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් තම අවසර පත්‍රය ඉදිරිපත් කරන ලෙස දන්වනු ලැබූ කවර අවස්ථාවකදී වුවද සෑම සංචාරක වෙළෙන්දෙකු විසින් තම අවසර පත්‍රය සහ ඊට අදාළ ලියවිලි ඉදිරිපත් කළ යුතු ය.

9. අවසරපත්‍රලාභී සංචාරක වෙළෙන්දෙක්ම වෙළඳාමේ ස්වාභාවය අනුව අවසර පත්‍රය යටතේ කාලය සීමා කර තිබේනම් හැර පෙ. ව. 06.00 සිට ප. ව. 10.00 දක්වා කාලය තුළ සිය ව්‍යාපාරික කටයුතුවල නිරතවීමට හිමිකම් ලබයි. එසේ වුවද සභාපතිවරයා විසින් එකී කාලසීමාවෙන් බැහැරව වෙළඳාමේ නිරත වීම සඳහා අවසර දෙනු ලදුව, ඒ බව බලපත්‍රයේ සඳහන් කර තිබේනම් එසේ සඳහන් කර ඇති කාලය තුළ වෙළඳාම් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

10. සංචාරක වෙළඳාම සඳහා සෑම අවසරපත්‍රලාභියකුම බෝවන රෝගයකින් පෙළෙන්නේ නම් වෙළඳ කටයුතු වල යෙදීමෙන් වැළකිය යුතු ය.

11. ආහාර විකිණීමේ ව්‍යාපාරයෙහි නිරතවී සිටින සෑම සංචාරක වෙළෙන්දෙක්ම පහත සඳහන් විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

(1) විකිණීමට රැගෙන යන ආහාර වලට මැස්සන් වැසීම වැළැක්වීමට සහ දූවිල්ල, අපද්‍රව්‍ය, දුර්ගන්ධය එකතුවීම වැළැක්වීමට හැකිවන සේ තබා ගත යුතු අතර, එම ආහාර පුද්ගලයන්ට ස්පර්ශ කිරීමටද ඉඩ නොදිය යුතු ය.

(2) ආහාර තබා ගන්නා වාහනය, පාපැදිය, කරත්ත, භාජන හා තැටි ආදිය සහ ආහාර සමග ස්පර්ශ වන සියලු උපකරණ හා උවාරණ නිතිපතා පිරිසිදුව තබාගත යුතු ය.

(3) ආහාර එතීම සඳහා පාවිච්චි කරනු ලබන කඩදාසි හෝ ද්‍රව්‍ය පිරිසිදු හා ඒ සඳහා සුදුසු තත්ත්වයක පැවතිය යුතු ය.

(4) ආහාර ස්පර්ශ කිරීම සඳහා පිරිසිදු උපකරණ හා මෙවලම් පාවිච්චි කළ යුතු ය.

(5) ආහාර විකිණීමේ කටයුතු සඳහා බෝවන රෝගයකින් පෙළෙන තැනැත්තෙකු නොයෙදිය යුතු ය.

(6) කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයින්ට අන්තරායදායක වන සේ හෝ පීඩාවක් වන සේ ගින්දර පාවිච්චි නොකළ යුතු ය.

(7) අපද්‍රව්‍ය හෝ අප ජලය පොදු ස්ථානවල නොදැමිය යුතු අතර, ඒවා සෞඛ්‍යාරක්ෂිත ආකාරයට ඉවත් කිරීම සඳහා සභාපතිවරයා සෑහීමකට පත්වන ආකාරයට විධිවිධාන සලසා තිබිය යුතු ය.

12. සෝ ඝාතක ආඥාපනත යටතේ සඳහන් කර ඇති සතකුගේ හෝ සතුන්ගේ මස් කිසිදු සංචාරක වෙළෙන්දෙකු විසින් විකිණීම නොකළ යුතු ය.

13. කිසියම් වසංගත රෝගයක් හෝ බෝවන රෝගයක් පැතිරෙමින් පවතින හෝ පැතිරී ඇති ප්‍රදේශයක වශයෙන් හෝ විශේෂ අවස්ථානුගත කරුණක් හේතුකොටගෙන සභාපතිවරයා විසින් සංචාරක වෙළඳාම නොකළ යුතු ප්‍රදේශයක්, කලාපයක්, වීථියක්, මංමාවතක්, ව්‍යාපාරයක් ප්‍රකාශ කර ඇති විටක වලංගු අවසර පත්‍රයක් ඇත්තේ වුවද එම ප්‍රදේශයක, කලාපයක, විථියක, මංමාවතක සංචාරක වෙළඳාම නොකළ යුතු ය.

14. සංචාරක වෙළඳාම් කාර්යයන්හිදී ජනනය වන අපද්‍රව්‍ය ඒ සඳහා නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලැබ ඇති ක්‍රමවේදයන්ට අනුකූලව මිස අන් කවර ආකාරයකට බාහිර පරිසරයට මුදා හැරීමක් නොකළ යුතු ය.

15. අතුරු ව්‍යවස්ථාව යටතේ අවසරපත්‍රයක් ලැබුවේ වුවද පොදු වෙළඳපළ පරිශ්‍රයක් තුළ සංචාරක වෙළඳාම නොකළ යුතු ය.

16. කිසියම් ස්ථානයක දීර්ඝ වේලාවක් රැඳී සිට වෙළඳාම කිරීම කිසිදු අවසරපත්‍රලාභියෙකු නොකළ යුතු ය.

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත

දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධය අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

"සභාව" යන්නෙන් නගර සභාව අදහස් වේ.
"සභාපති " යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.
"නගර සභා බල ප්‍රදේශය " යන්නෙන් නගර සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය අදහස් වේ.
"ආහාර" යන්නෙන් මනුෂ්‍ය පරිභෝජනය සඳහා ගනු ලබන ආහාර හා පාන වර්ග අදහස් කරනු ලැබේ.
"සංචාරක වෙළඳාම" යන්නෙන් තමා විසින්ම හෝ සතෙකුගේ ආධාරයෙන් හෝ වාහනයකින් හෝ කරත්තයකින් හෝ බයිසිකලයකින් හෝ ට්‍රයිසිකලයක් මගින් ද්‍රව්‍ය රැගෙන යමින් කරනු ලබන වෙළඳාමක් අදහස් වේ.

### *"අ" උපලේඛනය*

*සංචාරක වෙළඳාම සඳහා අවසරපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය*

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :——— .
2. ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය :——— .
3. ඉල්ලුම්කරුගේ තාවකාලික ලිපිනය :——— .
4. ඉල්ලුම්කරුගේ ජා. හැ. අ :——— .
5. ඉල්ලුම්කරුගේ දු. අ. :——— .
6. සංචාරක ව්‍යාපාරයේ ස්වභාවය :——— .
7. සංචාරක ව්‍යාපාරය සිදු කරනු ලබන ආකාරය :——— .
8. ඉල්ලුම් කරනු ලබන බල ප්‍රදේශය :——— .
9. ඉල්ලුම්කරු පදිංචි බල ප්‍රදේශය :——— .
10. අවසර පත්‍රය අවශ්‍ය කරනු ලබන කාල සීමාව :——— .
11. සංචාරක වෙළඳාම සිදු කරනු ලබන වාහනයේ ලියාපදිංචි අංකය :——— .

....................................
ඉල්ලුම්කරුගේ අත්සන.

*උපදෙස් :*

1. ස්ථිර පදිංචිය තහවුරු කිරීමට හැඳුනුම්පතේ පිටපත

අවසරපත්‍රය ලබා දීම සඳහා විෂය ලිපිකරුගේ වාර්තාව

...............................
විෂය ලිපිකරුගේ අත්සන

දිනය :..................................
අවසර පත්‍රය ලබාදීම නිර්දේශ කරමි/නොකරමි.

............................
ලේකම්

දිනය :................................
අවසර පත්‍රය ලබාදීම නිර්දේශ කරමි/නොකරමි.

............................
සභාපතිතුමා,

..............................
නගර සභාව.

*"ආ" උපලේඛනය*

සංචාරක වෙළඳාම සඳහා දෙනු ලබන අවසරයයි

1. අවසරපත් ලාභියාගේ සම්පූර්ණ නම :——— .
2. අවසරපත් ලාභියාගේ ජා. හැ. අ. :——— .
3. වෙළඳාම් ස්වභාවය :——— .
4. අවසරය දෙනු ලබන ප්‍රදේශය :——— .
5. අවසරය දෙනු ලබන කාල සීමාව :——— .

දිනය :..............................

..............................
සභාපති
......................ප්‍රාදේශීය සභාව

(මෙම කොටස ප්‍රකටව පෙනෙන පරිදි පැළඳ සිටිය යුතුය නැතහොත් ප්‍රදර්ශනය කළ යුතු ය.)

**ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සංචාරක වෙළඳාම සඳහා දෙනු ලබන අවසරපත්‍රයයි**

1. සම්පූර්ණ නම :——— .
2. ස්ථිර ලිපිනය :——— .
3. ජා. ඇ. අ. :——— .
4. අවසරපත්‍රලාභියාගේ අත්සන :——— .
5. අවසරය දෙනු ලැබූ ප්‍රදේශය :——— .
6. අවසරය දෙනු ලැබූ කාල සීමාව :——— .
7. වෙළඳාමේ ස්වභාවය :——— .
8. අවසරපත්‍ර ලාභියාගේ අත්සන :——— .

දිනය :..............................

..............................
සභාපති,
ප්‍රාදේශීය සභාව.

**ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ යම් මංමාවතකට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කර ඇති ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, පාලනය කිරීම, එසේ ප්‍රචාරණය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අයකිරීම සඳහා පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. කිසිම තැනැත්තෙකු විසින්, යම් මංමාවතකට පෙනෙන කිසිම දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම ඒ සඳහා නගර සභාවෙහි සභාපති විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ මිස කරනු නොලැබිය යුතු ය.

4. මෙම අතුරු ව්‍යස්ථාවේ කාර්යය සඳහා ප්‍රචාරක දැන්වීම යන්නෙන් ප්‍රධාන මාර්ගයට, අතුරු මාර්ගයට, පළාත් සභා, නගර සභා හෝ පෞද්ගලික මාර්ගයට පෙනෙන සේ පුවරු, බැනර්, කටවුට්, ඇලුමිනියම් තහඩු, යකඩ, පොලිතීන්, රෙදි හෝ කොළවල ඇඳීමෙන් ද නොමැති නම් ගැල්වනයිස් යකඩ යොදා සකස් දරන ද දැන්වීම් පුවරුවක් ද, නිවසක, කඩයක, හෝටලයක, බිත්තියක, තාප්පයක ආදී ස්ථානයක අකුරු හෝ රූප යොදා යම් වෙළඳ ස්ථානයක්, වෙළඳ භාණ්ඩයක්, ව්‍යාපාරයක් සඳහා කෙරෙන ප්‍රචාරක දැන්වීමක් ද, වෙළඳ ප්‍රදර්ශනයක, සැණකෙළියක ආදී උත්සව අවස්ථාවන්හිදී යොදන විශේෂ දැන්වීම් පුවරු ද අදහස් වන්නේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ

5. (1) කවර හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම මෙහි පලවන උපලේඛනයෙහි සඳහන් ආකෘතියට වියයුතු අතර මේ අතුරු ව්‍යවස්ථාවෙහි හයවන වගන්තියට අනුකූලව ඒ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනයට යටත් පිරිසෙයින් දින තුනකට කලින් සභාවෙහි සභාපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) නගර සභාව විසින් නිකුත් කරන ඉල්ලුම්පත්‍රයක් සඳහා අයකරනු ලබන ගාස්තුව සභාව කලින් කළ යෝජනා සම්මුතියක් මගින් තීරණය කළ හැකිය.

6. මෙම අතුරු ව්‍යවස්ථාවේ 5 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්පත්‍රයක් සමග පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලිය යුතු ය.

(1) දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන නිර්මිතයේ පිහිටීමට සාපේක්ෂ පරිමාවට නොඅඩු පරිමාවකින් අඳින ලද භූමි සැලැස්ම

(2) 1 : 1000 පරිමාවට නොඅඩු පරිමාවකට අඳින ලද නිර්මිතයේ රූ සටහන

(3) එම සැලැස්මේ, රූප සටහනේ හෝ පිරිවිතරයෙහි, මේ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලවනු පිණිස කරන සංශෝධන වෙතොත් ඒ සංශෝධන

(4) ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමෙහි යොදා ගන්නා වර්ණ සියල්ලම යොදා කුඩා පරිමාවක අඳින ලද ඒ දැන්වීමේ පිටපතක්

(5) යාබද වීථිවලට සහ ප්‍රධාන භූමි සළකුණුවලට සාපේක්ෂව ප්‍රචාරක දැන්වීමෙහි පිහිටීම දැක්වෙන සැලැස්ම.

7. නගර සභාවෙහි සභාපති විසින් ලියවිල්ලකින් අනුමත කරන ලද සැලසුම් වලට, රූප සටහන්වලට සහ පිරිවිතරයන්ට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත යම් ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස කිසිම පුවරුවක්, බිල් පුවරුවක්, දැන්වීම් පුවරුවක් හෝ වෙනත් යම් නිර්මිතයක් ඉදිකිරීම හෝ ඉදිකිරීමට සැළැස්වීම නොකළ යුතු ය.

8. මෙම අතුරු ව්‍යවස්ථාවේ 5 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක්ම නගර සභාවෙහි සභාපති විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක මෙහි පහත දෙවන උපලේඛනයෙහි සඳහන් ආකාරයට තීරණය කර නියමිත ගාස්තු ගෙවන තෙක් ඉල්ලුම්කරුට බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

9. ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් තැනැත්තෙකුට බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක ඔහු විසින් ප්‍රදර්ශනය කරනු ලබන සෑම ප්‍රචාරක දැන්වීමකම බලපත්‍රයේ යොමු අංකය සහ බලපත්‍රධාරියාගේ නම ඇතුළත් කරන ලෙස නගර සභාව විසින් ඒ තැනැත්තාට නියම කළ යුතු ය.

10. මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පහත දැක්වෙන ප්‍රචාරක දැන්වීම් කිසිවකට ඒ දැන්වීම් ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් හෝ ගුවන් නාම පුවරුවක් හෝ වන්නේ නම් මිස අදාළ නොවිය යුතු ය.

(අ) ලබන ශුද්ධ ආදායම් ප්‍රමාණය, පුණ්‍ය කටයුතු සඳහා යොදවන යම් ප්‍රසංගයකට අදාළ දැන්වීමක්

(ආ) කිසියම් ප්‍රසංගයක් පවත්වන ලබන ස්ථානයේ, ඒ ප්‍රසංගයට අදාළව ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීමක්

(ඇ) ආගමික, දේශපාලන මහජන රැස්වීමක් සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීමක්

(ඈ) "කුලියට දීමට තිබේ " යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක්

(ඉ) "විකිණීමට තිබේ" යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක්

(ඊ) ගෘහ නාම පුවරු

(උ) වෘත්තීය කටයුතු සඳහා යොදා ගනු ලබන, ප්‍රමාණයෙන් වර්ග මීටර් 0.93ක් නොඉක්මවන නාම පුවරුවක්

(ඌ) වෙළඳ කටයුත්තක් හෝ ව්‍යාපාරයක් සඳහා පාවිච්චි කරන වාහනයක් එම වෙළඳ කටයුත්තේ හෝ ව්‍යාපාරයේ ස්වාභාවය දැක්වෙන සහ අයිතිකරුගේ නම සහ ලිපිනය දුරකථන අංකය විද්‍යුත් තැපැල් ලිපිනය ආදිය දැක්වෙන ප්‍රචාරක දැන්වීමක්

11. කිසිම තැනැත්තෙකු විසින් ඃ-

(1) යම් වීථියක, පාරක හෝ අඩි පාරක රිය මඟට උඩින් හෝ හරහා හෝ නෙරා සිටින ආකාරයකට ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම

(2) පොළොවේ සිට මීටර් 15ක් ඉක්මවන උසකින් ඇති යම් පුවරුවක් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ

(3) කිසියම් වීථියකට හෝ පාරකට මුහුණලා යාව පිහිටි ගොඩනැගිල්ලක මුහුණතෙහි හෝ වෙළඳ ශාලා නාම පුවරුවක හෝ ඒ ගොඩනැගිලි මුහුණතෙහි සීමාව ඉක්මවා යන දිගකින් යුත් ප්‍රචාරක දැන්වීමක් සවි කොට නැතහොත් එල්ලා තැබීම.

(4) ගුවන් නාම පුවරුවක් ස්වරූපයේ ප්‍රචාරක දැන්වීමක් නගර සභාවේ පූර්ව අනුමැතිය ලබා නොගෙන යම් අකාරයකට තැනීම, ඉදිකිරීම නොකළ යුතු ය.

12. කිසිම තැනැත්තෙකු විසින්, පෞද්ගලික හෝ පොදු ගොඩනැගිල්ලක, පොදු පූජනීය ස්ථානයක, පොදු උද්‍යානයක හෝ යම් පාළමක හෝ පාරේ ඇති මාර්ග පාළමක, දුරකථන හෝ විදුලි රැහැන් කණුවක, පැති බැම්මක, වේල්ලක, අමුණක, බෝක්කුවක, පර්වතයක, ඉවුරක හෝ ගසක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය නොකළ යුතු ය.

13. සභාවේ යෝජනා සම්මතයක නිශ්චය කොට දැක්වෙන සහ ගැසට් පත්‍රයේ යථා පරිදි පළ කරන ලද යම් ප්‍රදේශයක කිසිම ප්‍රචාරක දැන්වීමක්, ඒ දැන්වීම නගර සභාවේ සභාපති විසින් අනුමත කළ ආකාරයට තනා හෝ ඉදිකර ඇති වෙළඳ ශාලා පුවරුවක් වන්නේ නම් මිස, ප්‍රදර්ශනය නොකළ යුතු ය.

14. කිසිම තැනැත්තෙකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත යම් වීථියක හෝ පාරක යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට හෝ හැඳින්වීමේ කාර්යය සඳහා ගුවන් විදුලි යන්ත්‍රයක්, ග්‍රැමර් ෆෝනයක්, සංගීත භාණ්ඩයක්, සීණුවක් හෝ වෙනත් උපකරණයක් නගර සභාවේ සභාපතිවරයාගේ අවසරයකින් තොරව පාවිච්චි කිරීම නීත්‍යානුකූල නොවන්නේ ය.

15. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ,

(1) යම් ප්‍රචාරක දැන්වීමක්, අවලස්සන හෝ පිළිකුල් සහගත හා මහජන සාදාචාරයට හානිකරන යමක් නිරූපණය කරන අවස්ථාවක නගර සභාවේ සභාපති විසින් ලිඛිත නිවේදනයක් මගින් ඒ නිවේදනයේ නිශ්චය කොට දැක්වෙන යම් කාලයක් ඇතුළත ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශණය කිරීම නතර කරන ලෙස ඒ ප්‍රචාරක දැන්වීම සිදු කරන තැනැත්තාට නියම කළ හැකිය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ ඉහත I වන උපවගන්තිය යටතේ නිවේදනයක් භාර දෙනු ලැබූ කවර හෝ තැනැත්තෙකු විසින් එහි නිශ්චිත කොට දැක්වෙන කාලය ඇතුළත ඒ නිවේදනය අනුව ක්‍රියා කළ යුතු ය.

16. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය පිණිස ප්‍රයෝජනයට ගන්නා යම් පුවරුවක අයිතිකරු හෝ බදු කරු විසින්,

(1) ඒ පුවරු නිසි අළුත්වැඩියාවෙන් යුතුව සහ තැනැත්තන්ගේ ආරක්ෂාව තහවුරු වන ආකාරයෙන් පවත්වාගෙන යා යුතු ය.

(2) ඒ පුවරු ඉදිරිපස, ප්‍රකටව පෙනෙන තැනක පැහැදිලි හා කියවිය හැකි අකුරෙන් ඔහුගේ නම සහ ලිපිනය ප්‍රදර්ශනය කළ යුතු ය.

17. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා නියමිත බලපත්‍ර ගාස්තුව ගෙවා ඇති බව පෙන්වීමට යම් ප්‍රචාරක දැන්වීමක නගර සභාව විසින් ඇතුළත් කර ඇති යම් ලාංඡනයක්, සළකුණක්, අක්ෂරයක්, වචනයක් හෝ ඉලක්කමක් කිසිම තැනැත්තෙකු විසින් විරූප කිරීම හෝ නොකළ යුතු ය.

18. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

19. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයකින් තොරව නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව සභාව විසින් ඉවත් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

20. එලෙස යම් තැනැත්තෙකු හෝ ආයතනයක් දිගින් දිගටම බලපත්‍රයක් ලබා නොගෙන ප්‍රචාරක දැන්වීම් පළ කිරීම හේතු කොට ගෙන හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සඳහන් කොන්දේසි කඩ කිරීම හේතුකොටගෙන වරදකට වැරදිකරුවකු වී ඇති අවස්ථාවක දී එකී තැනැත්තා හෝ ආයතනය එම නගර සභා බල ප්‍රදේශය ප්‍රචාරක කාර්යයන් සඳහා අසාධු ලේඛනගත කිරීම පිළිබඳ නගර සභාව තීරණය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

21. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලැබීමෙන් පසු අවසර පත්‍රයේ වලංගු කාලය ඉදිරියට ඉතිරිව තිබියදී වුව ද, යම් අයුරකින් සවිකරන ලද, බිත්තියක හෝ තාප්පයක අඳින ලද බැනරයක්, කටවුට් එකක් ප්‍රචාරක දැන්වීම් පුවරුවක් කෙසේ හෝ සුළඟට ඇලවී, ගැලවී, බිම ඇද වැටී හෝ දුර්වර්ණ වී කැඩී බිඳී, වෙනස් වී නගරයේ අලංකාරයට කුමන අයුරකින් හෝ හේතු වේ නම් එබඳු දැන්වීම් පිළිබඳ ලිඛිත දැන්වීමක් අදාල අයිතිකරු වෙත භාර දී දින 7ක් ඇතුළත යථා පරිදි සකස් කිරීමට කටයුතු කළ යුතු අතර, එසේ නොමැති නම් සභාව විසින් එය ඉවත් කිරීම කල යුත්තේ ය. සභාව විසින් එසේ දැන්වීමෙන් දින 14ක් ගතවීමෙන් පසු සභාවේ සේවකයන් යොදවා දැන්වීම ඉවත් කිරීමට සිදුවුවහොත් එහි දැන්වීම පිළිබඳ කිසිම වගකීමක් සභාව විසින් දරනු නොලැබේ.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ

"සභාව" යන්නෙන් නගර සභාව ද,
"සභාපතිවරයා" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා ද,

*01 උපලේඛනය*

*ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධ ඉල්ලුම්පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——— .
02. ස්ථිර ලිපිනය :——— .
03. දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන වෙළඳ ව්‍යාපාරය, උත්සවය, ප්‍රදර්ශනය, සැණකෙළිය, රැස්වීම හෝ වෙළඳ ද්‍රව්‍ය පිළිබඳ විස්තරය :——— .
04. දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට බලාපොරොත්තු වන ස්ථානය/ස්ථාන :——— .
05. අදාළ ආකෘතිය අමුණා තිබේද ? :——— .
06. ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දැන්වීම් වර්ගය (බැනර්, පුවරු, කටවුට්, බිත්ති, තාප්ප සහ ස්ථාවර)
07. යම් අයුරකින් තම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලැබීමෙන් පසුව ද දැන්වීම් දුර්වර්ණ වීම, ඇල වීම, ගැලවීම, බිමට කඩා වැටීමක් සිදුවුවහොත් යථා පරිදි සකස් කිරීමට එකඟ වන්නේ ද ? යන්න

නගර සභාවේ පිළිගත් නියමයන්ට එකඟව දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට එකඟ වන අතර, ඒ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හෝ එහි යම් වගන්තියක් උල්ලංඝනය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව ද, හොඳාකාරවම මම දනිමි.

..................................
(අයදුම්කරුගේ අත්සන).

දිනය :——— .

පහත සඳහන් ලිපි ලේඛන අමුණා ඇත.

i. ප්‍රචාරක දැන්වීම ස්ථාවර එකක් නම් එය සවිකරනු ලබන ඉඩමේ අයිතිකරුගෙන් ලබා ගන්නා ලද කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපිය
ii. එකී දැන්වීම නිවසක, කඩයක, හෝටලයක, බිත්තියේ, තාප්පයේ හෝ එවැනි තැනක අදිනු ලබන්නක් නම් එකී තාප්පය, බිත්තිය, කඩය, හෝටලය, අයිතිකරුගේ කැමැත්ත පළ කළ ලිපිය.
iii. ප්‍රචාරක දැන්වීම ඇඳීම හෝ ස්ථාවරව සවි කිරීම සඳහා භූමිය (අවකාශය) යොදාගන්නා ආකාරය පිළිබඳ විස්තරය
iv. ප්‍රචාරක දැන්වීමට අදාළ ආකෘතිය පැහැදිලිව ඉදිරිපත් කළ යුතු ය. (අවසර පත්‍රය නිකුත් කිරීමෙන් පසු ආකෘතිය කෙසේවත් වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ)

*02 උපලේඛනය*

| අනු අංකය | පුවරුවේ ස්වභාවය | වර්ග මීටර් ප්‍රමාණය | ගාස්තුව රුපියල් | | |
|---|---|---|---|---|---|
| | | | මාස 03ට අඩු | මාස 3 හෝ 06 අතර | වසරක් |
| 01 | කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 1ට අඩු | 250/- | 350/- | 500/- |
| | | 1ට වැඩි | 1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින් | | |
| 02. | රෙදි, ඩිජිටල් බැනර් සඳහා | 3ට අඩු | 250/- | 350/- | 500/- |
| | | 3ට වැඩි | 3ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින් | | |
| 03. | තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1ට අඩු | 500/- | 750/- | 1000/- |
| | | 1ට වැඩි | 1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300/- බැගින් | | |
| 04. | විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1ට අඩු | 500/- | 750/- | 1000/- |
| | | 1ට වැඩි | 1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300/- බැගින් | | |
| 05. | ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 1ට අඩු | 250/- | 350/- | 500/- |
| | | 1ට වැඩි | 1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින් | | |
| 06. | ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 1ට අඩු | 250/- | 350/- | 500/- |
| | | 1ට වැඩි | 1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින් | | |
| 07. | විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1ට අඩු | 750/- | 850/- | 1000/- |
| | | 1ට වැඩි | 1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500/- බැගින් | | |

**ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මේ අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ (මෙහි මින්මතු සභා "බල ප්‍රදේශය" යනුවෙන් හඳුන්වනු ලබන) ත්‍රීරෝද රථ නවතා තැබීම, විධිමත් කිරීම, පාලනය කිරීම හා නවතා තැබීමේ ස්ථාන සඳහා ගාස්තු අය කිරීම සඳහා පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ,

(1) සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබිය යුතු ස්ථාන (මෙහි මින්මතු නැවතුම්පළ යන්නෙන් හඳුන්වනු ලබන) සහ එකී එක් එක් ස්ථානයේ නවතා තැබිය යුතු උපරිම ත්‍රී රෝද රථ සංඛ්‍යාව සභාවේ යෝජනා සම්මුතියක් මගින් තීරණය කළ යුතු අතර, එම තීරණය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට හෝ එහි සඳහන් කරනු ලබන නිශ්චිත දිනක හෝ සිට ක්‍රියාත්මක වන්නේ ය.

(2) ඉහත (1) උපවන්තිය අනුව තීරණය කළ ත්‍රී රෝද රථ නවතා තබන ස්ථාන හා සංඛ්‍යාව සංශෝධනය කළ යුතු යැයි සභාවට හැඟී යන්නේ නම් සභා සම්මුතියක් මගින් එසේ කළ හැකි අතර, එය ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(3) ත්‍රීරෝද රථ නැවතුම් පොළ ස්ථාන නිශ්චය කිරීම එහි පරාසයන් තීරණය කිරීම හා නතර කළ හැකි උපරිම ත්‍රී රෝද රථ සංඛ්‍යාව තීරණය කිරීම සඳහා හෝ එම තීරණය සංශෝධනය කිරීම සඳහා පළමුවන උපලේඛනයේ සඳහන් අයගෙන් සමන්විත රථ වාහන කමිටුවක නිර්දේශ සභාව විසින් ලබා ගත යුතු ය.

(4) ඉහත (1) උපවගන්තිය අනුව ත්‍රී රෝද රථ නවතා තැබිය යුතු ස්ථාන හඳුනා ගැනීම පිණිස වන පුවරුවක් සෑම නැවතුම් පොළක ඉදිරිපිට සවිකළ යුතු වන අතර එම පුවරුවේ අදාල නැවතුම් පොළේ සංකේත අංකය ප්‍රදර්ශනය කළ යුතු ය. තවද, (2) උපවගන්තිය අනුව නැවතුම්පොළක නවතා තැබිය හැකි උපරිම ත්‍රීරොද රථ සංඛ්‍යාව අදාළ පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය.

(5) නැවතුම්පොළෙහි ත්‍රීරෝද රථ ක්‍රමානුකූලව නවතා තැබිය යුතු අතර, නවතා තැබිය යුතු ආකාරය සභාවේ බලයලත් නිලධාරියෙකු විසින් පළල අඟල් 04ක් වූ සුදු හෝ කහ පැහැති රේඛාවක් මගින් සළකුණු කර තිබිය යුතු ය.

4. නගර සභාව විසින් ත්‍රීරෝද රථ නවතා තැබීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාවට සාරානුකූලව සකස් කරන ලද අවසරපත්‍රයක් සභාපතිවරයා විසින් නිකුත් කිරීම හා ඒ සඳහා ගාස්තු සභා සම්මුතියක් මගින් තීරණය කර අය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

5. ත්‍රීරොද රථ නැවතුම් පොළක නවතා තබන ත්‍රීරොද රථ අවසර පත්‍ර ලබා දීමේ දී නැවතුම්පොළට ආසන්නතම පදිංචිකරුවන්ට අයත් ත්‍රීරෝද රථවලට ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය.

6. (1) මෙම අතුරු ව්‍යවස්ථාවේ උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද අයදුම්පත්‍රයක් මගින් තම ස්ථිර පදිංචියට ආසන්නතම ත්‍රී රෝද රථ නැවතුම්පළෙහි ත්‍රී රෝද රථය නවතා තැබීම සඳහා නගර සභාවෙන් අවසරපත්‍රයක් ඉල්ලුම් කළ යුතු අතර, එකී අවසර පත්‍රය සඳහා ගාස්තු සභාව විසින් කළින් කළ තීරණය කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

7. ත්‍රීරෝද රථ පදවන්නා අයිතිකරු නම්, ඔහුගේ ද පදවන්නා කුලී රියදුරෙකු නම් ඔහුගේ සහ අයිතිකරුගේ ද පහත සඳහන් ලේඛණවල ඡායාස්ථ පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය. එම අයදුම්පත දෙවන උපලේඛනයේ සඳහන් පරිදි විය යුතු ය.

i. ත්‍රී රෝද රථ හිමිකරුගේ ජාතික හැඳුනුම්පත හා වලංගු රියදුරු බලපත්‍රය
ii. ත්‍රී රෝද රථයේ ලියාපදිංචි සහතිකය
iii. කුලී රියදුරන්ගේ ජාතික හැඳුනුම්පත හා වලංගු රියදුරු බලපත්‍රය

8. සභාවේ අවසරපත්‍රලත් ත්‍රීරෝද රථ සම්බන්ධ ලේඛණයක් පවත්වා ගෙන යා යුතු අතර, අවසරපත්‍රය අවලංගු කරනු ලැබූ විට ඒ බව සටහන් කර රතු තීන්තෙන් සලකුණු කළ යුතු ය.

9. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ මාසිකව හෝ ත්‍රෛයිමාසිකව හෝ වාර්ෂිකව හෝ ත්‍රීරෝද රථ නවතා තැබීම සඳහා අවසර පත්‍ර ලබා දිය හැක.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද වලංගු අවසරපත්‍රයේ ඡායා පිටපතක් පැහැදිලිව පිටතට පෙනෙන සේ ත්‍රීරෝද රථයේ ඉදිරිපස වීදුරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය.

11. ත්‍රීරෝද රථයේ දකුණු පසින් මගීන්ට නැගිම හෝ බැසීම කළ නොහැකි වන සේ අහුරා තිබිය යුතු ය.

12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවසරපත්‍රය ත්‍රීරෝද රථයෙහි ලියාපදිංචි හිමිකරු නමට නිකුත් කළ යුතු ය.

13. අවසර පත්‍රයේ වලංගු කාල සීමාව අවසන් වීමට සති දෙකකට පෙර අවසරපත්‍රය දීර්ඝ කරවා ගැනීම ත්‍රී රෝද රථ අයිතිකරු විසින් කළ යුතු ය.

14. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් නිකුත් කරන ලද වලංගු අවසරපත්‍රයක් ඇත්තේ නම් මිස, ත්‍රීරෝද රථ නැවතුම් පළකට ත්‍රීරෝද රථයක් ඇතුළු කිරීම හෝ නවතා තැබීම නොකළ යුතු ය.

15. නිකුත් කළ වලංගු අවසරපත්‍රයක් ඇත්තේ වුව ද පොලිස් නිලධාරියෙකු විසින් හෝ සභාපතිවරයා හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධාරියකු විසින් තාවකාලිකව ත්‍රී රෝද රථ නැවතුම්පොළෙන් ත්‍රීරෝද රථ ඉවත් කිරීමට විධාන කළ හැකි අතර, මෙම අවසරපත්‍රය ඊට බාධාවක් නොවිය යුතු ය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රකාශිත නැවතුම් පොළක වෙනත් වාහන ඇතුළු කිරීම හෝ නවතා තැබීම නොකළ යුතු ය.

17. නැවතුම් පොළට ඇතුළුවන ස්ථානයට හෝ ඉන් පිටවන ස්ථානයට බාධාවන අයුරින් ත්‍රීරෝද රථ හෝ වෙනත් වාහන හෝ නවතා තැබීම නොකළ යුතු ය.

18. නැවතුම් පොළ තුල ත්‍රීරෝද රථයක් එම ස්ථානයෙන් ඉවත් කර ගැනීම සඳහාවන අවම අළුත්වැඩියාවක් හැර, කිසිදු ආකාරයක අළුත්වැඩියාවක් නොකළ යුතු ය.

19. යම් ත්‍රීරෝද රථයක් නතර කර තැබීම සඳහා අවසරපත්‍රයක් ලබා ගෙන ඇත්තේ යම් නැවතුම්පොළකට ද එම අවසරපත්‍රය අදාළ වන නැවතුම්පොළෙහි හැර වෙනත් කවර හෝ ස්ථානයක කුලී ගමනක් අපේක්ෂාවෙන් ත්‍රීරෝද රථයක් නවතා තැබීම නොකළ යුතු ය.

20. (1) ත්‍රීරෝද රථ නැවැත්වීම සම්බන්ධයෙන් වන මේ අතුරු ව්‍යවස්ථා සතියේ සෑම දිනකම 06.00 පැය සිට 20.00 පැය දක්වා බලාත්මකව පැවතිය යුතු ය.

(2) ඉහත 20.(1) වැනි උපවගන්තියෙහි සඳහන් වේලාවන් සභාවේ අවශ්‍යතාවය මත සහා යෝජනා සම්මුතියකින් සංශෝධනය කළ හැකි අතර, එය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව ක්‍රියාත්මක විය යුතු ය.

21. අවසරපත්‍ර හිමි ත්‍රීරෝද රථ, නැවතුම්පොළක, නතර කර ඇති අවස්ථාවේ දී සේවයේ යෙදී සිටින රියදුරන්, පිටස්තර පුද්ගලයන් ත්‍රීරෝද රථ නැවතුම්පොළට කැඳවා, නිකරුනේ ගැවසීමට ඉඩ දීම නොකළ යුතු ය.

22. නැවතුම්පොළක කවර හෝ තැනැත්තෙකු විසින් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම හෝ දුරාචාරයේ හැසිරීම හෝ වෙනත් කිසිදු පීඩාකාරී ක්‍රියාවක් හෝ නොකළ යුතු අතර එවැනි ක්‍රියා කිරීම සඳහා ඉඩ නොදීමට නැවතුම්පළ භාවිතා කිරීමට අවසර ලද පුද්ගලයන්ගේ වගකීම වේ.

23. අවසරපත්‍රයක් හිමි කවර වූ හෝ තැනැත්තෙකු විසින් නැවතුම්පළක විෂමාචාර ක්‍රියාවක නිරත වූ බවට ජනතාවගෙන් පැමිණිලක් ලද අවස්ථාවක ඒ බව පරීක්ෂණයක් පවත්වා සනාථ වුවහොත් ඔහුගේ අවසරපත්‍රය අහෝසි කිරීමේ බලය සභාව සතු වේ.

24. සභාපතිවරයා හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ නිලධාරියකු හෝ පොලිස් නිලධාරියෙකු හෝ ඉල්ලා සිටි ඕනෑම විටක වලංගු අවසරපත්‍රයේ මුල් පිටපත ත්‍රීරෝද රථයේ රියදුරු හෝ අයිතිකරු විසින් ඉදිරිපත් කළ යුතු ය.

25. (1) මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා පනතේ 153 වගන්තියේ (2) වන උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

(2) ඉහත (1) උපවගන්තිය අනුව නිසි අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක පනවනු ලබන දණ්ඩනයකට අමතරව සභාපති විසින් අවසරපත්‍රය අහෝසි කළ යුතු වේ.

26. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් නගර සභාව ද,
"සභාපති " යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා ද,
"සභාපති " විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ බලයලත් නිලධාරියෙකු " යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරනු ලබන නගර සභාවේ යම් නිලධාරියකු ද,
"බල ප්‍රදේශය" යන්නෙන් නගර සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය ද,
"ත්‍රී රෝද රථය" යන්නෙන් කුළී ගමන් අපේක්ෂාවෙන් නවතා තබා ගන්නා වූ ත්‍රී රෝද රථයක් ද,
"කුළී රියදුරකු " යන්නෙන් ත්‍රී රෝද රථය පදවන අයිතිකරු හෝ එම රථය පැදවීම සඳහා අයිතිකරු විසින් යොදවා ඇති අය ද,
"නැවතුම්පොළ" යන්නෙන් නගර සභාව විසින් යෝජනා සම්මුතියක් මගින් නිශ්චය කරනු ලැබූ ත්‍රී රෝද රථ නැවතුම්පොළ ද,
"නියමිත නැවතුම්පොළ යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා විසින් අවසරපත්‍රයක් නිකුත් කරන ලද යම් නිශ්චිත නැවතුම්පළක් ද,
"මාසිකව" යන්නෙන් එක් එක් මාසය ආරම්භයේ පළමු වැනිදා සිට ඒ ඒ මාසයට අදාල දින 28 හෝ දින 30 හෝ 31 කින් සමන්විත වූ මාසයකින්,
"ත්‍රෛමාසිකව" යන්නෙන් මාසිකව යන අර්ථය කථනය මගින් දී ඇති දින ගණන ඇති ජනවාරි 01 වනදායින් ආරම්භව අනුයාත මාස 03 බැගින් දෙසැම්බර් 31 වැනිදා දක්වා ද,
"වාර්ෂික" යන්නෙන් වර්ෂයක ජනවාරි 01 වැනිදායින් ආරම්භ දෙසැම්බර් 31 වැනිදායින් අවසන්න වන ලිත් වර්ෂයක් ද,
"පොලිස් නිලධාරියෙකු " යන්නෙන් 53 වන අධිකාරිය වන 1865 අංක 16 පොලිස් ආඥාපනතේ 104 වගන්තිය මගින් දී ඇති අර්ථකථනයම ද,
"වෙනත් වාහන" යන්නෙන් මෝටර් වාහන ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකථනයම ද,
"ලියාපදිංචි හිමිකරු" යන්නෙන් මෝටර් වාහන ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකථනයම ද,
"පීඩාකාරී ක්‍රියාව" යන්නෙන් පීඩන ක්‍රියා ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකථනයම ද අදහස් වේ.

### *පළමුවන උපලේඛනය*

පත් කරනු ලබන රථවාහන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

01. කමිටුවේ සභාපතිවරයා නගර සභාවේ සභාපතිවරයා විය යුතු ය. ලේකම් සභාවේ ආදායම් පරීක්ෂකවරයා විය යුතු ය.

02. නගර සභාවේ ලේකම් සහ කාර්මික නිලධාරී

03. මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු හෝ ඔහු නම් කරනු ලබන නියෝජිතයකු

04. පළාත්බඳ මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියොජිතයකු

05. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකු

06. ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකු

07. නගර සභා බල ප්‍රදේශයට අයත් පොලිස් ස්ථානයන්හි රථ වාහන පොලිස් ස්ථානාධිපතිවරුන් හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකු බැගින්

08. නගර සභා බල ප්‍රදේශය තුළ ඇති ත්‍රීරෝද රථ සංගම්වල නියෝජිතයකු බැගින්

### *දෙවන උපලේඛනය*

ත්‍රීරෝද රථ නවතා තැබීම සඳහා අවසර පත්‍රය

01. අයදුම්පත්‍රය

(i) අයදුම්කරුගේ නම :
(ii) ස්ථිර පදිංචි ලිපිනය :

(iii) වරිපනම් අංකය :
(iv) ස්ථිර පදිංචියට අදාළ පළාත් පාලන ආයතන :
(v) ජාතික හැඳුනුම්පත් අංකය :

02. (i) ත්‍රීරෝද රථ ලියාපදිංචි අංකය :
(ii) පදවන්නා අයිතිකරු ද නැතිනම් කුලී රියදුරුද යන වග :

1) අයිතිකරු නම් වලංගු රියදුරු බලපත් අංකය :
2) කුලී රියදුරකු නම් :

ස්ථිර පදිංචි ලිපිනය :
ජාතික හැඳුනුම්පත් අංකය :
වලංගු රියදුරු බලපත් අංකය :

03. අවසරපත්‍රය ඉල්ලුම් කරනු ලබන ත්‍රීරෝද රථ නැවතුම්පළ
04. අවසරපත්‍රය ඉල්ලුම් කරන කාලය : මසකට/මාස 03කට/අවුරුද්දකට

මවිසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, යම් හෙයකින් එම තොරතුරු සාවද්‍ය බව තහවුරු වුවහොත් මාගේ ත්‍රීරෝද රථ අවසරපත්‍රය පූර්ව දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමට යටත් බවත්, නගර සභාව විසින් පනවා අති ත්‍රීරෝද රථ නැවැත්වීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන් පිළිපැදීමටත් එකඟ වෙමි.

.................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :.............................

................................................................මහත්මා/මහත්මියට ..............................................අංක දරන ත්‍රීරෝද රථය .................................. දරන නැවතුම්පොළෙහි නැවැත්වීම සඳහා අවසරපත්‍රය ......................................................................කාලයකට ලබා දීම අනුමත කරමි.

.....................................
සභාපති,
................................ප්‍රාදේශීය සභාව.

දිනය :..............................

**සේවා සඳහා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභාව විසින් සපයන සේවාවන් විධිමත් කිරීම, එකී සේවාවන් සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම සඳහා පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා සේවාවන් සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාවට අදාල සේවාවන් යන්නට පහත සඳහන් දේ අදාළ වේ.

(1) ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම, ඊට පහත සඳහන් දේ ඇතුළත් ය.

(i) නගර සභාව විසින් පවත්වගෙන යනු ලබන පෙර පාසැල් සඳහා ඇතුල්වීමේ ඉල්ලුම්පත්‍ර

(ii) නගර සභාව විසින් පවත්වාගෙන යන පුස්තකාල සාමාජිකත්වය සඳහා ඉල්ලුම්පත්‍ර

(iii) වරිපනම් ලේඛනයෙහි උධෘත ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර

(iv) සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත්‍ර

(v) වීථි රේඛා සහතිකයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර

(vi) නොපවරා ගැනීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර
(vii) සභාව සතු යන්ත්‍රෝපකරණ සේවාව ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත.

(2) සහතික පත්‍ර නිකුත් කිරීම, ඊට පහත සඳහන් දේ ඇතුළත් ය.

(i) වීථි රේඛා සහතික
(ii) නොපවරා ගැනීමේ සහතික
(iii) වරිපනම් ලේඛන ආශ්‍රයෙන් හිමිකම් පිළිබඳ සහතික
(iv) වරිපනම් ලේඛන වල උද්‍ධෘත සනාථ කරන සහතික
(v) නිකුත් කරන ලද තක්සේරු නිවේදන සනාථ කරන සහතික

4. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත 3 වන වගන්තිය යටතේ විස්තර කර ඇති එක් එක් සේවාවන් සම්බන්ධයෙන් වන ගාස්තු කළින් කළ සභා සම්මුතියක් මගින් තීරණය කළ යුතු ය.

5. (1) ඉහත 3 වන වගන්තියෙහි (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයක් යටතේ හෝ ඒ සමග ඉල්ලුම්පත්‍රය නිසියාකාරව සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් මාලාවක් ඇතුළත් විය යුතු ය.

(2) එසේ නිකුත් කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයක් සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවෙහි 4 වන වගන්තිය යටතේ තීරණය කර ඇති පරිදි වන ගාස්තු ගෙවා ඊට අදාල ලදුපත ඉදිරිපත් කර ඇත්තේ නම් එය කිසිදු ඉල්ලුම්පත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

6. (1) මෙම අතුරු ව්‍යවස්ථාවේ 3 වන වගන්තියෙහි (2) වන උප වගන්තිය යටතේ විස්තර කරන සේවා අපේක්ෂිත සෑම තැනැත්තෙක්ම, ඊට අදාල ඉල්ලුම්පත්‍රය යටතේ නිශ්චිතව සඳහන් කර ඇති අවශ්‍යතා සම්පූර්ණ කරමින් සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් ඒ සඳහා නිශ්චිතව බලය දී ඇති නිලධාරියෙකු වෙත අදාල ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

(2) නිසියාකාරව සම්පූර්ණ නොවූ හෝ ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් අවශ්‍යතා සම්පූර්ණ නොවුන කිසිදු ඉල්ලුම්පත්‍රයක් භාර නොගත යුතු අතර, භාර ගනු ලබන ඉල්ලුම්පත්‍රයක් ඉහත 3 වන වගන්තියෙහි (2) වන උපවගන්තියට අදාල සේවාවන් වෙනුවෙන් වන විට දී, භාරගත් දිනෙන් දින තුනක් ඇතුළත ඊට අදාල සේවාව ඉටු කිරීම සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් ඒ සඳහා නිශ්චිතව බලය දී ඇති නිලධාරියකුගේ කාර්යය වන්නේ ය.

7. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයක් සභාපතිවරයා හෝ ඒ සඳහා නිශ්චිතව බලය දී ඇති නිලධාරියකු භාරගනු ලබන්නේ නම්, ඒ සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය යටතේ තීරණය කර ඇති ගාස්තු ඒ සඳහා අයකළ යුතු අතර, එසේ ඉදිරිපත් වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම ලේඛනගත කළ යුතු ය.

8. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකවඩා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොඩකවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් නගර සභාව ද,
"සභාපතිවරයා " යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා ද,
''ලේකම්'' යන්නෙන් නගර සභාවේ ලේකම් තනතුර සඳහා පත්වී ඇති අයෙකු ද,
"බලයලත් නිලධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා සභාවේ නිශ්චිතව රාජකාරී පැවරුමක් යටතේ කාර්යය කටයුතු ඉටු කරන අයකු ද ඇතුළත් වෙයි.

## ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශයේ පොදු ක්‍රීඩා භූමි විධිමත් කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

3. (1) නගර සභාව සතු කිසියම් ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන යම් තැනැත්තෙකු මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමුවන උපලේඛණයේ දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ ඉල්ලුම්පත්‍රයක් ඒ සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(2) ඉල්ලුම්පත්‍රයක් සඳහා අයකළ යුතු ගාස්තු සභාව, සභා සම්මුතියක් මගින් කළින් කළ තීරණය කරනු ලබන ගාස්තුවක් විය යුතු ය.

4. 3. වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙකු වෙත නගර සභාව සතු කිසියම් ක්‍රීඩාභූමියක් පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමේදී මෙහි පහත දැක්වෙන කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් අවසර පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(1) ක්‍රීඩා භූමි ප්‍රයෝජනයට ගැනීමට අවසර පත්‍රයක් ඉල්ලීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම නගර සභා කාර්යාලයට ලැබුණු අනුපිළිවෙල අනුව සළකා බැලිය යුතු ය. එසේ වුව ද ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීමට ලැබෙන ඉල්ලුම්පත්‍ර අතරින් කිසියම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩාවකට සම්බන්ධ යම් කාරණයක් සම්බන්ධයෙන් වන ඉල්ලුම්පත්‍රයකට ඉහළ ප්‍රමුඛතාවය දිය යුතු ය.

(2) නගර සභාව විසින් කලින් කළ තීරණය කර ප්‍රකාශයට පත් කරනු ලබන ආකාරයට ක්‍රීඩා භූමි වෙන් කිරීමේ ගාස්තුව සහ තැන්පත් මුදල් ගෙවීමෙන් අනතුරුව පමණක් අවසර පත්‍රය නිකුත් කළ යුතු ය.

5. පරිහරණය කිරීම සඳහා ක්‍රීඩා භූමියක් වෙන් කර ගැනීමට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම, එකී වෙන් කිරීම අපේක්ෂා කරන දිනයට අවම වශයෙන් දින තුනකට පෙර සිදු කළ යුතු ය. කවර හෝ තැනැත්තෙකු විසින් කෙරෙන ඉල්ලීම, ක්‍රීඩා භූමිය වෙන් කර ගැනීමට අවශ්‍ය වන දිනට දින තුනකට පෙර කාර්යාලීය වේලාව තුළ ඉදිරිපත් කළ යුතු ය.

6. මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ වෙන් කර ගන්නා ලද කිසියම් ක්‍රීඩා භූමියක, එකී වෙන් කර ගැනීම අවලංගු කරවා ගැනීමට යම් ඉල්ලුම්කරුවකුට අවශ්‍ය වන අවස්ථාවක පහත සඳහන් කොන්දේසි වලට යටත්ව ඉඩදීමට සභාපතිවරයාට හැකිය.

(1) වෙන් කිරීම අවලංගු කිරීමට ඉල්ලීම කරනු ලබන්නේ, ක්‍රීඩා භූමිය වෙන් කර ගනු ලැබූ දිනට -

(i) මාස තුනකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පහක්,
(ii) මාස දෙකකට පෙර වන විට ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට දහයක්,
(iii) මාසයකට පෙර වන විට ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පහලොවක්,
(iv) දින පහලොවකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට විසිපහක්,
(v) දින හතකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පනහක්,
(vi) දින තුනකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට හැත්තෑ පහක්,

නගර සභා අරමුදලේ රඳවා ගැනීමට යටත් විය යුතු ය.

(2) වෙන් කිරීම අවලංගු කිරීමට ඉල්ලීම කරනු ලබන්නේ, ක්‍රීඩා භූමිය වෙන් කර ගනු ලැබූ දිනට දින තුනකට වඩා අඩු කාලයක දී නම් ගෙවනු ලැබූ ගාස්තුව ආපසු ගෙවනු නොලැබිය යුතු ය.

(3) කිසියම් වෙන් කිරීමක් අවලංගු කරවා ගනු ලැබූ විටකදී එකී වෙන් කර ගැනීම සඳහා ගෙවනු ලැබූ තැන්පතු මුදල සම්පූර්ණයෙන්ම ලබා ගැනීමට ඉල්ලුම්කරුට හිමිකම් තිබිය යුතු ය.

7. කිසියම් තැනැත්තෙකු විසින් වෙන් කර ගනු ලැබූ ක්‍රීඩා භූමියක් වෙන් කර ගත් කාර්යයට හැර වෙනත් කවර හෝ කාර්යයකට යොදා ගැනීම නොකළ යුතු ය.

8. ක්‍රීඩා භූමියක් වෙන් කිරීමට නිකුත් කරන ලද අවසර පත්‍රයක්, කවර හෝ හේතුවක් මත වෙනත් තැනැත්තෙකුට පැවරීම නොකළ යුතු ය.

9. කවර හෝ තැනැත්තෙකු විසින් ක්‍රීඩා භූමියක් වෙන් කර ගැනීම සඳහා කෙරෙන ඉල්ලීමකට ඉඩ නොදෙන අවස්ථාවකදී, එසේ ඉඩ නොදීමට හේතුවන කරුණු සඳහන් කරමින් ඒ බව ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ දිනයේ දීම එකී ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම්දීම සභාපතිවරයාගේ කාර්යය වන්නේ ය.

10. කිසියම් කාර්යයක් සඳහා වෙන් කර ගනු ලැබූ ක්‍රීඩා භූමියක්, එසේ වෙන් කරගත් දිනය වෙනස් කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඉල්ලුම්කරු විසින් ඒ පිළිබඳව ලිඛිතව සභාපතිවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය. එකී ඉල්ලීම අනුව වෙන් කළ දිනය සංශෝධනය කිරීම 4 වන සහ 5 වන අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට යටත් විය යුතු ය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවෙහි දැක්වෙන විධිවිධාන අනුව ක්‍රීඩා භූමියක් කිසියම් කාර්යයක් සඳහා වෙන් කර නොමැති කවර හෝ අවස්ථාවක එකී ක්‍රීඩා භූමිය, ක්‍රීඩා කිරීම හෝ ක්‍රීඩා පුහුණුවීම් කටයුතු හෝ සඳහා යොදා ගැනීමට ඉඩදීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

12. කිසියම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබූ ක්‍රීඩා භූමියක් අදාළ කාර්යය සඳහා පාවිච්චි කිරීමෙන් අනතුරුව නගර සභාවේ තැන්පත් කරනු ලැබූ තැන්පත් මුදලෙන්,

(1) ක්‍රීඩා භූමිය හෝ එහි යම් කොටසකට හෝ සිදුවී ඇති යම් අලාභයක් වේ නම් ඒ අලාභයේ වටිනාකම

(2) ක්‍රීඩා භූමිය වෙන් කරගනු ලැබූ කාලසීමාට වඩා වැඩිපුර යොදා ගනු ලැබූ කාලය වෙනුවෙන් අයකර ගත යුතු ගාස්තුව අඩුකර ගැනීමෙන් අනතුරුව ඉතිරිවන යම් මුදලක් පමණක් ඉල්ලුම්කරුට ආපසු ගෙවනු ලැබිය හැකිය.

13. කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභාව සතු කිසියම් ක්‍රීඩා භූමියකට හානි පැමිණවීම හෝ එසේ හානි වීමට සැලැස්වීම නොකළ යුතු අතර ක්‍රීඩා භූමිය තුළට ගවයන්, ඌරන්, අශ්වයන්, පෝනියන් හෝ බල්ලන් ඇතුල් කිරීම නොකළ යුතු ය. එසේම තවදුරටත්, සභාපතිවරයාගෙන් ලබාගත් අවසරයක් නොමැතිව කිසිදු වාහනයක් කවර හෝ ක්‍රීඩා භූමියකට ඇතුල් කිරීම නොකළ යුතු ය.

14. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වෙන් කරගනු ලැබූ කිසියම් ක්‍රීඩා භූමියක් එසේ වෙන් කරගනු ලැබූ දිනයේ දී නගර සභාවේ කිසියම් අත්‍යවශ්‍ය කාර්යයක් සඳහා අවශ්‍ය වන විටක, එකී වෙන් කිරීම අවලංගු කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුවද එවැනි අවලංගු කිරීමක් සිදු කරනු ලබන්නේනම් එකී අවලංගු කිරීම ක්‍රීඩා භූමිය වෙන් කරනු ලැබූ දිනට දින තුනකට පෙර ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම්දිය යුතු වුවත් ඔහු විසින් ගෙවන ලද ගාස්තුව සහ තැන්පත් මුදල සම්පූර්ණයෙන්ම ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතුය. තවදුරටත් එසේම, එවැනි අවලංගු කිරීමක්, වෙන් කරගනු ලැබූ දිනට පෙර දින තුනකට වඩා අඩු කාලයකදී සිදු නොකළ යුතු ය.

15. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවෙහි -

"සභාව" යන්නෙන් නගර සභාව අදහස් වේ

"සභාපති " යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.

''නගර සභා බල ප්‍රදේශය" යන්නෙන් නගර සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය අදහස් වේ.

"ක්‍රීඩාභූමිය '' යන්නෙන් ක්‍රීඩා කිරීම සඳහා නගර සභාව විසින් වෙන්කර දෙනු ලැබූ කිසියම් ක්‍රීඩා භූමියක් අදහස්වන අතර ක්‍රීඩා භූමිය වටා ඉදිකර ඇති තාප්පය හෝ වැට හෝ ඒ තුළ ඉදිකර ඇති යම් ගොඩනැගිල්ලක් හෝ ඒ කිසියම් ඉදිකිරීමක කොටසක් හෝ කිසියම් සවිකිරීමක් හෝ උපකරණ ද ඊට ඇතුළත් විය යුතු ය.

"ක්‍රීඩාව' යන්නෙන්, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ ඊට දී ඇති අර්ථයම අදහස් විය යුතු ය.

*පළමුවන උපලේඛනය*

.............................නගර සභාවේ ...................................ක්‍රීඩා භූමිය පරිහරණය සඳහා අවසර ලබා ගැනීමට ඉල්ලුම් පත්‍රය

01. ඉල්ලුම්කරුගේ නම :....................................................................................................................
ලිපිනය :...................................................................................................................................
ජාතික හැඳුනුම්පත් අංකය :.........................................................................................................
02. ක්‍රීඩා භූමිය ඉල්ලුම්කරන කාරණය :..............................................................................................
03. අවශ්‍ය කරන දිනය හා වේලාව :..........................................................................................................

| දින සිට | දින තෙක් | වේලාව |
|---|---|---|
| ................................ | ...................................... | ..................................... |

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මේ ඉල්ලීමට අනුව අදාළ ක්‍රීඩා භූමිය වෙන්කර දෙනු ලැබුවහොත් එම ක්‍රීඩා භූමියේ ගොඩනැගිලිවලට, ඉදිකිරීම්වලට, උපකරණවලට සහ සවිකිරීම්වලට කිසියම් හානියක් වුවහොත් එහි අලාභය තැන්පත් මුදලින් නගර සභාව විසින් අයකර ගනු ලැබීමට එකඟවන අතර එකී තැන්පත්

මුදල ඒ අයකිරීම සඳහා ප්‍රමාණවත් නොවන විට තවදුරටත් අවශ්‍ය වන මුදල් නගර සභාවට ගෙවීමට ද එකඟ වෙමි. එසේම ක්‍රීඩා භූමි විධිමත් කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපැදීමට ද එකඟ වෙමි.

........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :................................

*දෙවන උපලේඛනය*

*ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීමට අයකරන ගාස්තු චක්‍රය*

| | ක්‍රීඩා භූමියේ නම | ගාස්තුව<br>රු. ශ. | තැන්පත් මුදල<br>රු. ශ. | අතිරේක පැයකට ගාස්තුව<br>රු. ශ. |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |
| 03 | | | | |
| 04 | | | | |

**මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම පරීක්ෂා කිරීම හා මස් විකුණන ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීමේ හා ඒ සඳහා ගාස්තු අය කිරීම සඳහා ද පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. නගර සභා බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව මස් විකිණීමේ කාර්යය සඳහා යම් ස්ථානයක් පාවිච්චි නොකළ යුතු ය.

4. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රය ලබා ගැනීමට ඉල්ලුම් කරන වෙළඳ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ තැනැත්තෙකුට මස් වෙළඳ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

    (1) මස් විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන කොටස පිඟන් ගඩොල් කපරාරු කළ සිමෙන්ති හෝ මළ නොබැඳෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතු ය.

    (2) මස් විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම සිමෙන්ති බදාමෙන් මැදීම කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

    (3) අප ජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්ලූ කාණු තිබිය යුතු ය.

    (4) (3) ඡේදයේ සඳහන් කාණු තුළින් ගලායන අප ජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාමට වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී අපජලය උරා ගන්නා වලකට ගලායාමට ඉඩ සලස්වා තිබිය යුතු ය.

    (5) අප ජලය ගලා යාමට සලස්වන ලද උරා ගන්නා වල වාතයට නිරාවරණය නොකළ යුතු ය.

    (6) මස් වෙළඳ ස්ථානයෙන් බැහැර කරනු ලබන ජෛවභායන අප ද්‍රව්‍ය බහා ලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළඳාම් කටයුතු අවසානයේ එකී අප ද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 05ක්

ගැඹුරෙන් වළ දැමීම හෝ ප්‍රාදේශීය සභාව විසින් කළින් කළ තීරණය කර නියම කරනු ලබන නියමයන්ට අනුකූලව බැහැර කිරීම කළ යුතු ය.

(7) ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් ජල මුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතු ය.

(8) බලපත්‍රධාරියා විසින් එම වෙළඳ ස්ථානයෙහි ඔහුගේ නම, ලිපිනය, බලපත්‍ර අංකය සමග මස් වෙළඳ සැළක් වශයෙන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් යුත් නාම පුවරුවක් සවිකර තිබිය යුතු ය.

5. ගෝ ඝාතක ආඥාපනතේ නියමයන් යටතේ විධිමත් බලපත්‍රයක් ලබා ඇති ගෝ ඝාතාකාගාරයේ දී මරනු ලැබූ කිසියම් සතෙකුගේ මස් වන්නේ නම් මිස කවර හෝ මස් වෙළඳ ස්ථානයක අලෙවි කිරීම සඳහා හෝ අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ කවර තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

6. බලපත්‍රලත් කවර හෝ මස් වෙළඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිමද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද මස් කැපීම සඳහා ගන්නා කොට ද, උපකරණ ද, මස් විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන ද, විෂ බීජ නාශක දියර යොදා සෝදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

7. බලපත්‍රලත් කවර හෝ මස් වෙළඳ ස්ථානයක සහ එහි අවට කාණු ද, මස් ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියලු භාජන සහ උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතු ය.

8. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මස් අධි ශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම්, හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මස් වෙළඳ සැල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුනේ නම් මිස ශේෂවන කවර හෝ මසක් ඊළඟ දිනයේ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධි ශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබා ගැනීම හෝ නොකළ යුතු ය.

9. කවර හෝ ගෝ ඝාතාකාගාරයක් තුළ කිසියම් දිනයක දී හෝ කාල වකවානුවක මස් පිණිස සතුන් මැරීම තහනම් කරමින් ගෝ ඝාතක ආඥාපනතේ විධිවිධාන ප්‍රකාර නිසි අධිකාරය විසින් නියමයක් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක, කවර හෝ මස් කඩයක වෙළඳාම් පිණිස මස් තබා ගැනීම හෝ වෙළඳාම පිණිස මස් ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම නොකළ යුතු ය.

10. බලපත්‍රලත් කවර හෝ මස් වෙළඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන්, කෘමින් හෝ වෙනත් කවර හෝ සතුන්ගෙන් තොරව තබා ගත යුතු ය.

11. බලපත්‍රලත් ස්ථානයෙහි මස් දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර කිසිම භාණ්ඩයක් හෝ ඇඳුමක් හෝ නිදාගන්නා පැදුරක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ පාවිච්චියට ගැනීම සඳහා බීමට සුදුසු ජලය ප්‍රමාණවත් ප්‍රමාණයක් තබා ගැනීම කළ යුතු ය.

13. (1) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂන කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ මස් වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක වෙළඳාමෙහි හෝ එසේ වෙළඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩ දීම හෝ නොකළ යුතු ය.

(2) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මස් වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(3) මස් වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

14. මස් වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයකු වෙතම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් මස් වෙළඳ ස්ථානයෙහි සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

15. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකු ම විසින් ප්‍රයෝජනයට ගැනීම පිණිස සබන් හෝ සබන් දියර තබා තිබීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

16. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් මස් වෙළඳ ස්ථානයෙහි විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ඇතුළත ගබඩා කර ඇති යම් මස් වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

17. (1) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය

(i) ජෛවභායන අපද්‍රව්‍ය
(ii) වීදුරු
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය
(iv) පොලිතීන් හෝ ප්ලාස්ටික් හෝ පොලිතීන් හෝ ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය
(v) යකඩ හෝ වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්,
(vii) අන්තරායකර අපද්‍රව්‍ය

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(2) ඉහත (1) උපවගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අප ද්‍රව්‍ය නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට මස් වෙළෙඳ ස්ථානයේ මස් වෙළඳාම කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

19. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වන වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල හෝ වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූලව තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

20. 19 වැනි වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලැබෙන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

21. 20 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දිර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

22. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ

හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා පනතේ 153 වගන්තියේ (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් නගර සභාව අදහස් වේ.
"සභාපති " යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.
"නගර සභා ප්‍රදේශය " යන්නෙන් නගර සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය අදහස් වේ

## අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ අවමංල්‍ය සේවා සැපයුම් ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සඳහා පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස හැඳින්වේ.

3. කිසියම් තැනැත්තෙකු විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නගර සභාවේ සභාපතිවරයාගෙන් ලබා ගත් බලපත්‍රයක් යටතේ හැර අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන නොයා යුතු යි.

4. මෙම අතුරු ව්‍යවස්ථාවේ තුන්වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම සභාපතිවරයා විසින් කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබුවේ යම් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් විය යුතු ය.

5. මෙම අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නගර සභාවේ සභාපතිවරයා විසින් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයකට බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(1) අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ ඇතුලත මෘතදේහ සැකසීම පිණිස වෙන්වූ කාමරයක් තිබිය යුතු අතර, එකී කාමරයේ එක් පුද්ගලයෙකුගේ මෘත දේහයක් සැකසීම සඳහා අවම වශයෙන් වර්ග මීටර් නවයකට නොඅඩු ඉඩ කඩක් තිබිය යුතු ය. එසේම එකී කාර්යය සිදු කිරීමට ප්‍රමාණවත් කොන්ක්‍රීට් වේදිකාවක් තිබිය යුතු ය.

(2) මෘත දේහ සැකසීම කරනු ලබන කාමරය සෑම විටම අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ ප්‍රදර්ශන ශාලාවෙන් වෙන් වී තිබිය යුතු අතර බාහිර පුද්ගලයන්ට අවසරයකින් තොරව ඇතුළුවීම වලක්වා තිබිය යුතු ය.

(3) මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයේ අභ්‍යන්තරයට පිරිසිදු වාතය ලැබෙන පරිදි කාමරයේ වර්ගඵලයෙන් හතෙන් එකකට නොඅඩු ප්‍රමාණයකට කවුළු සකසා තිබිය යුතුය.

(4) මෘත දේහ සැකසීම කිරීමේදී ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස් තාවකාලිකව බහාලීමට ප්‍රමාණවත් භාජන තිබිය යුතු අතර එකී කාර්යය කරන අවස්ථාවේදී මෘත ශරීරයෙන් බැහැර වන ලේ හෝ වෙනත් යම් දියර හෝ මෘත දේහ සේදීම කරනු ලබන්නේ නම් එකී අප ජලය රැස්කර ගැනීම සඳහා අපාරගම්‍ය හා මැස්සන් මීයන් හෝ වෙනත් සතුන්ට ප්‍රවේශ විය නොහැකි වන සේ හොඳින් වසා තැබිය හැකි ආකාරයේ භාජන තබා තිබිය යුතු අතර එම අපද්‍රව්‍ය කිසිම හේතුවක් නිසා පොදු කාණුවකට පොදු ඇල මාර්ගයකට හෝ එළිමහන් භූමියකට ගලා යාමට ඉඩ සැලැස්වීම නොකළ යුතු ය.

(5) බලපත්‍ර ලත් ස්ථානයේ මහජන ගෞරවය පිණිස මෘත දේහ තබා ගැනීමට ඉඩ සලසා ඇති විට කිසියම් මෘත දේහයකට අවසන් ගෞරව දැක්වීමට පැමිණෙන තැනැත්තන්ගේ පහසුව පිණිස ප්‍රමාණවත් ආසන සංඛ්‍යාවක් තැබීමට හා එසේ පැමිණෙන අයගේ වාහන නැවතීමට ප්‍රමාණවත් ඉඩකඩ වෙන්කර තැබිය යුතු ය.

(6) විකිණීම සඳහා තබා ඇති මෘත දේහ බහාලන පෙට්ටි (මිනී පෙට්ටි) හා මල් වඩම් ආදිය ප්‍රදර්ශනය කිරිමේදී එසේ ප්‍රදර්ශනය කරනු ලබන ශාලාව හෝ කාමරය කළු වීදුරු යොදා පිටතට නොපෙනෙන පරිදි සකස් කර තිබිය යුතු ය.

6. අවමංගල්‍ය සේවා ස්ථානයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය සෑම තැනැත්තෙකුම විසින් මේ කොටසේ පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට පිළියල කර ගත් අයදුම්පත්‍රයක් නගර සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

7. මෘත දේහයක් සැකසීමේදී ඉවත් කරනු ලබන හෝ ඉවත් වන මෘත ශරීර කොටස් මහෙස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂක වරයෙකු හෝ විසින් ඒ පිළිබඳව ලබා දී ඇති නියෝගයක් නොමැති නම් එකී කොටස් ඒ කාර්යය අවසන් වී පැය හයක් ගත වීමට මත්තෙන් පොලොවේ මතුපිට සිට මීටර් 1.2ක් ගැඹුරු වලක වල දමා මැනවින් වසා තැබිය යුතු ය.

8. මෘත දේහයක් සැකසීමේදී ඉවත් කරනු ලබන හෝ ඉවත් වන මෘත ශරීර කොටස් පිළිබඳව මහේස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් නියෝගයක් කර ඇති විටක ඒ නියෝගයට අනුව ක්‍රියා කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

9. 7 වන වගන්තියේ සඳහන් කාර්යයන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ නොමැති විටක සභාව විසින් කලින් කළ තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසුව එකී කාර්යය නගර සභාවේ පොදු සුසාන භූමිය ඇතුළත මෙම අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ගැඹුරු වලක දමා වසා දැමිය යුතු ය.

10. මෘත දේහ සැකසීම කරන කාමරය නිරන්තර විෂබීජ නාශක යොදා පිරිසිදුව පවත්වා ගැනීම කළ යුතු ය.

11. මෘත දේහ සැකසීම කරනු ලබන කාමරවල වැඩ කරන සියළුම සේවකයන්ට නගර සභාවේ සභාපතිවරයා විසින් නිර්දේශ කරනු කරනු ලබන ආකාරයේ ආරක්ෂිත ඇඳුම්, මුවවැසුම් හා අත්වැසුම් ලබා දීම සහ මෘත දේහ සැකසීම කරනු ලබන අවස්ථාවේදී එකී සේවකයන් ඒ ඇඳුම් වලින් හා පැලඳුම් වලින් සැරසී අදාළ කාර්යයේ නියුක්ත වන බවට වගබලා ගැනීමට බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියළුම සේවකයන් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. මෘත දේහ ප්‍රවාහනය කරනු ලබන රථය හෝ රථය ඇතුළත අවම වශයෙන් දිනකට එක් වතාවක් බැගින් රික්ත ශෝධක මගින් පිරිසිදු කර විෂබීජ නාශක යොදා තිබිය යුතු ය.

නගර

14. අධික වශයෙන් තුවාල සිදු වීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා සැකසීම කළ නොහැකි අන්දමින් පවතින මෘත දේහ හැර වෙනත් මෘත දේහ තැන්පත් කරනු ලබන පෙට්ටියක ඇතුළත හෝ මෘත දේහය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ ආවරණය කිරීම පිණිස පොලිතීන් හෝ දිරාපත් නොවන වෙනයම් ද්‍රව්‍යයක් හෝ භාවිතා නොකළ යුතු ය.

15. නගර සභාවේ සභාපතිවරයා විසින් නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව ඔහු විසින් ඒ වෙනුවෙන් බලපත්‍රලාභියාට දෙන ලිඛිත අවසරයක් ඇත්තේ නම් මිස කොළරාව, මහාමාරිය, වසූරිය කහ උණ හෝ ඒඩ්ස් රෝගයෙන් මියගොස් ඇති බවට සැලකෙන කිසියම් තැනැත්තෙකු විසින් මෘත දේහයක් බලපත්‍රලත් තැන වෙත ගෙන ඒම හෝ ගෙන ඒමට ඉඩ දීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

16. කිසියම් මෘත දේහයක් සැකසීමට සහ අවමංගල්‍ය කටයුතු සංවිධානය පිණිස භාර ගැනීමට පෙර එකී මරණය සම්බන්ධයෙන් මරණ ලියාපදිංචි කිරීමේ නිලධාරියා විසින් නිකුත් කරනු ලැබූ විධිමත් මරණ සහතිකයක් තමා වෙත ඉදිරිපත් කර ඇත්තේ නම් මිස එකී කාර්යයන් සඳහා මෘත දේහයක් භාර ගැනීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතු ය.

17. කිසියම් මෘත ශරීරයට අදාළ මරණය හදිසි මරණයක් වන විටක හෝ එකී මරණය සැක සහිත වන විටක මහෙස්ත්‍රාත් වරයෙකු විසින් කරනු ලැබූ හදිසි මරණ පරීක්ෂණයකින් අනතුරුව නිකුත් කරනු ලැබූ වාර්තාවක් මගින් එකී මෘත දේහයේ අවසන් කටයුතු සම්බන්ධයෙන් දෙනු ලැබ ඇති කිසියම් නියෝගයක් වේ නම් බලපත්‍රලාභියා විසින් එකී නියෝගයේ විධිවිධාන පිළිපදිනු ලැබිය යුතු ය.

18. මහේස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු විසින් කරනු ලැබූ වාර්තාවක් මගින් එකී මෘත දේහයේ අවසන් කටයුතු සම්බන්ධයෙන් දෙනු ලැබ ඇති කිසියම් නියෝගයක් වේ නම් බලපත්‍රලාභියා විසින් එකී නියෝගයේ විධිවිධාන පිළිපදිනු ලැබිය යුතු ය.

19. මහජන ගෞරවය පිණිස මෘත දේහයක් තබනු ලබන ස්ථානය පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීමට සැලැස්ස වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

20. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය ආසන්නයේ පදිංචිකරුවන්ට කරදරකාරී වන්නා වූ හෝ පීඩාකාරී වන්නා වූ හෝ කවර කාර්යයක් අවමංගල්‍ය සේවා ස්ථානයේ පරිශ්‍රය තුළ දී සිදු කිරීම හෝ එසේ කිරීමට ඉඩ දීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විට ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම ඒ දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා අඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස

''සභාව'' යන්නෙන් නගර සභාව ද,

''සභාපති '' යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා ද

''බලය පවරනු ලැබූ නිලධාරියා'' යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද

''අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය'' යන්නෙන් කිසියම් මෘත ශරීරයක් කල් තබා ගැනීමට හැකිවන පරිදි සැකසීම කරනු ලබන හෝ මෘත ශරීරයක් අවසන් කටයුතු සඳහා සැකසීම කරනු ලබන හෝ අවසන් කටයුතු කිරීමට සුසාන භූමියක් දක්වා ගෙනයනු ලබන තෙක් කිසියම් මුදලක් අයකර මහජන ගෞරවය පිණිස තබා තිබෙන ස්ථානයක් ද,

"මෘත දේහ සැකසීම" යන්නෙන් මියගිය පුද්ගලයෙකුගේ මෘත දේහය අවසන් ගෞරවය පිණිස කල් තබා ගැනීමට හැකිවන වන ආකාරයට පිළියෙල කිරීම, එකී මෘත දේහයට ඇඳුම් ඇන්දවීම මෘත දේහය යම් පෙට්ටියක තැන්පත් කිරීම හා එකී කාර්යය සඳහා අවශ්‍ය වන වෙනත් ඕනෑම කාර්යයක් සිදු කිරීම ද,

''මෘත ශරීර කොටස් යන්නෙන් මියගිය පුද්ගලයන්ගේ මෘත දේහයෙන් ඉවත් කරනු ලබන යම් ශරීර අවයවයක් හෝ ඉන් කොටසක් හෝ අභ්‍යන්තර කොටසක් හෝ මෘත ශරීරයෙන් බැහැර කරන ලේ හෝ වෙනත් දියරයක් හෝ මියගිය අය ඒ අවස්ථාවේදී හැඳ සිටි යම් ඇඳුමක් හෝ ඇඳුම් හෝ ඉන් කොටසක් හෝ මිය ගිය අයගේ ශරීරයේ තිබූ කිසියම් තුවාලයක හෝ වෙනයම් හේතුවක් නිසා ඔහුගේ ශරීර අභ්‍යන්තරයේ තිබූ කිසියම් තුවාලයක හෝ වෙනයම් හේතුවක් නිසා ඔහුගේ ශරීර අභ්‍යන්තරයේ තිබූ හෝ තිබෙන වෙඩුම් පටි, පුළුන් හෝ වෙන යම් ද්‍රව්‍යක් ද අදහස් වේ.

### *"අ" උපලේඛනය*

*අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන සඳහා අවසරපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය*

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :-
2. ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය :-
3. ඉල්ලුම්කරුගේ තාවකාලික ලිපිනය :-
4. ඉල්ලුම්කරුගේ ජා. හැ. අ :-
5. ඉල්ලුම්කරුගේ දුරකථන අංකය :-
6. ඉල්ලුම්කරනු ලබන බල ප්‍රදේශය :-
7. ඉල්ලුම්කරු පදිංචි බල ප්‍රදේශය :-
8. අවසර පත්‍රය අවශ්‍ය කරනු ලබන කාල සීමාව :-
9. අවමංගල්‍ය සේවා සිදු කරනු ලබන වාහනයන්හි ලියාපදිංචි අංකය :-

නගර සභාවේ පිළිගත් නියමයන්ට එකඟව අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පවත්වාගෙන යාමට එකඟ වන අතර, ඒ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හෝ එහි යම් වගන්තියක් උල්ලංඝනය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව ද, හොඳාකාරවම මම දනිමි.

.....................................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :-.......................................

01-489

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.